# “සුනිල සයුරක පහසින් ධරණීය සංවර්ධනයක් කරා”

## වාර්ෂික වාර්තාව 2014

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# පටුන


| | | |
|---|---|---|
| 1 | පසුබිම | |
| | 1.1 හැඳින්වීම | 8 |
| | 1.2 අධිකාරියේ වගකීම සහ කාර්යභාරයන් | 8-10 |
| 2 | පාලන වාර්තාව | 11-12 |
| 3 | විගණන කළමනාකරණ කමිටු වාර්තාව | 13-14 |
| 4 | මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය | 15-22 |
| 5 | පරිපාලන, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා නීති අංශවල සේවය සහ වගකීම | |
| | 5.1 පරිපාලන අංශය | 23 |
| | 5.2 නීති අංශය | 24-25 |
| | 5.3 අභ්‍යන්තර විගණන අංශය | 25 |
| | 5.4 මානව සම්පත් සංවර්ධන අංශය | 25-27 |
| | 5.5 මූල්‍ය අංශය | 28-30 |
| 6 | අධිකාරියේ ගිණුම්කරන ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන හා සටහන් | |
| | 6.1 ගිණුම්කරන ප්‍රතිපත්ති | 31-33 |
| | 6.2 2014.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 34 |
| | 6.3 2014.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය | 35 |
| | 6.4 2014.12.31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 36 |
| | 6.5 2014. වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 37 |
| | 6.6 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 38-48 |
| | 6.7 මූල්‍ය තත්ත්ව ප්‍රකාශ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා | 49 |
| | 6.8 මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශ 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා | 50 |
| 7 | විගණකාධිපති වාර්තාව | 51-60 |




**1981** වර්ෂයේ අංක **59** දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය ස්ථාපනය කරන ලදී. සමුද්‍ර දූෂණය වැලැක්වීම, අවම කිරිම හා පාලනය සඳහා කටයුතු කිරීම සහ ශ්‍රී ලංකා රජයට අදාල වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරීම උදෙසා අධිකාරිය වෙත පැවරි තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරිමට එවකට පැවති පනත අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ නව පනත සම්මත කරන ලදුව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

# <u>සංස්ථාමය තොරතුරු</u>

## අධිකාරියේ නම

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය**

## නෛතික පුද්ගලභාවය

**2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති නියාමන ආයතනයකි.**

## ලියාපදිංචි ලිපිනය සහ ප්‍රධාන කාර්යාලය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 758, බේස්ලයින් පාර,
කොළඹ 09.
ටෙලි: 011 2687520/011 2690604/ 011 2690605
ෆැක්ස් :011 2687451/011 4615960
ඊ මේල් :: info@mepa.gov.lk  වෙබ්: mepa.gov.lk

## අධ්‍යක්ෂ මණ්ඩලය

### සභාපති

වී. එන්. විජේගුණවර්ධන (විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති) (පත්කල දිනය-2014.04.15)

### අධ්‍යක්ෂකවරු

ආර්.ආර්.ආර්.ඒ. රූපසිංහ මහතා
අතිරේක ලේකම්, පරිසර අමාත්‍යාංශය

කොමදෝරු එන් .පී .ආටිගල
අධ්‍යක්ෂක මෙහෙයුම් , ශ්‍රී ලංකා නාවික හමුදාව

එස්.එන්. මයාදුන්නේ බණ්ඩාර මිය
නීති උපදේශ, විදේශ කටයුතු අමාත්‍යාංශය

පී.එස්.එම්. ජයතිලක
සහකාර අධ්‍යක්ෂ ,ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

එච්.සී.බී.එම්. හේරත් මහතා
අතිරේක ලේකම්, ධිවර අමාත්‍යාංශය

ඒ. ඩබ්.සෙනවිරත්න මහතා .
අධ්‍යක්ෂක ජෙනරාල් ,වෙළඳ නැව්, දෙපාර්තමේන්තුව

නීතිඥ මහේෂ් කටුලන්ද මහතා
(අමාත්‍යතුමා විසින් පත්කල සාමාජික)

ජේ .ඒ .ඒ .රණසිංහ මහතා
(අමාත්‍යතුමා විසින් පත්කල සාමාජික)

ආචාර්ය පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර මහතා
සාමාන්‍යාධිකාරී
(පත්කල දිනය 2014.08.04)

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරි සමග සම්බන්ධ විය හැකි ස්ථාන

ප්‍රධාන කාර්යාලය
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 758, බේස්ලයින් පාර, කොළඹ 09.
ටෙලි: 011 2687520/011 2690604/ 011 2690605
ෆැක්ස්:011 2687451/011 4615960
ඊ මේල් : info@mepa.gov.lk  වෙබ්: mepa.gov.lk

**1 බස්නාහිර හා වයඹ පළාත් කාර්යාලය සහ කොළඹ දිස්ත්‍රික් කාර්යාලය**
අංක 758, බේස්ලයින් පාර, කොළඹ 09.
ටෙලි: 011 2687520/011 2690604
ෆැක්ස්:011 2687451/011 4615960

**2 දිස්ත්‍රික් කාර්යාලය–කළුතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
187,3 මහල, ගාලු පාර, බේරුවල.
ටෙලි:034 2298407/071 8100821
ෆැක්ස්: 034 2298407

**3 දකුණු පළාත් කාර්යාලය සහ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
04, ක්ලෝසන් බර්ග් පාර, මාගල්ල, ගාල්ල.
ටෙලි: 091 2233547/071 8214184
ෆැක්ස්: 091 2233547

**4 දිස්ත්‍රික් කාර්යාලය - මාතර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
18, විල්මට් බාලසූරිය මාවත, නූපේ,මාතර.
ටෙලි: 041-2234250/071 4926849
ෆැක්ස්: 041 2234250

**5 දිස්ත්‍රික් කාර්යාලය– හම්බන්තොටදිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
අංක 46, දෙවන මහල, පරිපාලන සංකිර්ණය,
සිරිබෝපුර,හම්බන්තොට.
ටෙලි: 047 2256372/071 3624651
ෆැක්ස්: 047 2256372

**6 දිස්ත්‍රික් කාර්යාලය - අම්පාර දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ල, ග්‍රාමසභා මාවත,
තම්බිලුවිල්
ටෙලි: 067 2265416
ෆැක්ස්: 067 2265416

**7 නැගෙනහිර පළාත් කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලය –ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
4 කණුව, ත්‍රිකුණාමලය.
ටෙලි:026 2050805/071 8383363
ෆැක්ස්: 026 2050805

**8 දිස්ත්‍රික් කාර්යාලය - යාපනය දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,යාපනය.
ටෙලි: 021 2212663
ෆැක්ස්: 021 2212663

**9 දිස්ත්‍රික් කාර්යාලය–පුත්තලම දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
23,ඊබට් සිල්වා වත්ත, කොළඹ පාර, හලාවත.
ටෙලි:031 2222865/071 8099899
ෆැක්ස්: 032 2222865

**10 දිස්ත්‍රික් කාර්යාලය– ගම්පහ දිස්ත්‍රික්කය**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
704/9A, දෙවන කුරන, කොළඹ පාර, මීගමුව.
ටෙලි:031 2228606/071 8325678
**ෆැක්ස්: 031 2228606**

# සභාපතිතුමාගේ පණිවුඩය,

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්විමේ පනතේ ස්ථාපිත කර ඇති සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපය තුළ සමුද්‍ර දූෂණය වැලැක්වීම, අවම කිරීම හා පාලනය කිරීම සඳහා කටයුතු කරනු ලබයි. සමුද්‍රීය දූෂණ වැලැක්විමේ පනත මගින් සමුද්‍රීය ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමේදි ඉටු කර ගැනීමට බලාපොරොත්තු වු අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සකස් කිරීම, ඒවා කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාවේ යෙදවීම සිදු කිරීම උදෙසා සමුද්‍ර දූෂණ වැලැක්විමේ පනතේ 51 වන වගන්තිය යටතේ රෙගුලාසි 4 ක් සකස් කොට ඒවා ක්‍රියාත්මක කරමින් අදාල අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය කරන කටයුතු සිදු කර ඇත.

සභාපති ධූරයට පත් වු දිනය පටන් අධිකාරියේ අභ්‍යන්තර පාලන ක්‍රම හා වාර්තා කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීමට හා ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ක්‍රියාවට නගනු ලැබීය. වසර තුළදී රුහුණු විශ්ව විද්‍යාලයේ ආචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා ලෙස පත්කර ගනු ලැබීය. නව සාමාන්‍යාධිකාරීවරයා බඳවා ගැනීමත් සමඟ ඔහුගේ දැනුම, කුසලතා සහ දැක්ම මත අධිකාරියේ ඉදිරි ගමන් මඟ හා විකාශනය වඩාත් සුභදායී වනු ඇතැයි අපේක්ෂා කරමි.

2014 වර්ෂය තුළ අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදුකරන ක්‍රියාකාරකම් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කරන ලදී. එසේම අධිකාරිය විසින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති දෙකක් වසර තුළදී ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී. බැලැස්ට් ජලය මගින් පැමිණිය හැකි ආගන්තුක හා ආක්‍රමණශීලි ජීවි විශේෂ හඳුනාගැනීම සඳහා ව්‍යාපෘතිය 2014 වසර තුළ අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘති සඳහා ජයවර්ධනපුර, රුහුණු, කැළණිය හා වයඹ විශ්වවිද්‍යාල හා නාරා ආයතනය ආදියෙහි ක්ෂේත්‍ර ප්‍රවීනයන් සහභාගි විය. 2014 වර්ෂයේදි ත්‍රිකුණාමලය, ගාල්ල හා හම්බන්තොට වරායන් ආශ්‍රිතව සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී. මේ වන විට එම සමීක්ෂණවල අවසන් වාර්තාව සකස් කරමින් පවතී. මෙමගින් ලංකාවේ වරායන් වෙත පැමිණෙන ජීවින් හා ආක්‍රමණශීලි ජීවින් පවතින්නේදැයි යන්න සොයාබැලීමට හැකි අතර වරාය ආශ්‍රිත මූලික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමද සිදුවිය.

ලංකාව තුළ හරිත ධීවර වරාය සංකල්පය ඇති කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ අධිකාරිය විසින් ධීවර වරාය නීතිගත සංස්ථාව සමඟ එක්ව හරිත ධීවර වරාය ව්‍යාපෘතිය මිරිස්ස ධීවර වරාය පදනම් කරගෙන ආරම්භ කල අතර මෙම ව්‍යාපෘතිය 2014-2016 වසර දෙක තුළ ක්‍රියාත්මක වේ. මෙමගින් මිරිස්ස ධීවර වරාය හරිත ධීවර වරායක් ලෙස ගොඩනැගීමට බලාපොරොත්තු වේ.

අවසාන වශයෙන් 2014 වර්ෂය තුළදී 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉතා කැපවීමෙන් හා උනන්දුවෙන් සිය යුතුකම නොපිරිහෙලා ඉටු කරමින් සහය ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩලයටත් සාමාන්‍යාධිකාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පුද කරමි.

ටී. එන්. විජේගුණවර්ධන
සභාපති



# දැක්ම

"2020 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ
ජනතාව සහ
ශ්‍රී ලංකා ආර්ථිකයෙහි යහ පැවැත්ම
සහ
චිරස්ථායි සංවර්ධනය සඳහා
ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර
සමුද්‍රීය පරිසරයක්
ඇති කිරීම."

# මෙහෙවර

"වර්තමාන සහ අනාගත පරම්පරාව සඳහා සමුද්‍රීය පරිසරය චිරස්ථායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ඵලදායී ලෙස විධි නියමයන් බලාත්මක කිරීම, අදාල අන්තර්ජාතික ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීම සහ පරදූදරන්නන් සහ වෙනත් සම්පත් සමායෝජනය කොට මෙහෙවර යෙදවීම මගින් ශ්‍රී ලංකා පරිසරයෙහි

සමුද්‍රීය දූෂණය වැලැක්වීම, පාලනය සහ
කළමනාකරණය
සඳහා අවශ්‍ය කුසලතා,
නිපුණතා,සංවිධානීය ව්‍යුහය
සහ යටිතල රාමුවක් ඇති ආයතනයක්
බවට පත්වීම."

# 1 ,පසුබිම

## 1.1 හැඳින්වීම

දිවයිනක් ලෙස ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ උපාය මාර්ගික වැදගත් ස්ථානයක පිහිටා ඇත. අන්තර්ජාතික නීතින්ට අනුකූලව ශ්‍රී ලංකාවට එහි ගොඩබිම් ප්‍රදේශය මෙන් අටගුණයක් පමණ විශාල සාගර කලාපයක සම්පත් නෙලා ගැනිමේ අයිතිය හිමිව පවතී. අප රටට අයත් සාගර කලාපය තුළින් පෙර අපර දෙදිග යාකරන අන්තර්ජාතික නෞකා මාර්ගය වැටී ඇත. ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපය ස්භාවික සම්පත් රාශියකින් සමන්විත වන අතර මෙම සම්පත් නාවික ගමනාගමනය හා ගොඩබිමෙහි සිදු කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ක්‍රමයෙන් දූෂණයට ලක් වෙමින් පවති.

ඒ අනුව අපේ සමුදුර සම්පත් දූෂණයෙන් තොරව පවත්වාගෙන යාම සඳහා 1981 වර්ෂයේ අංක 59 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනත අනුව සමුද්‍ර දූෂණ වැලැක්වීමේ අධිකාරිය ස්ථාපනය කරන ලදී. සමුද්‍ර දූෂණය වැලැක්වීම, අවම කිරිම හා පාලනය සඳහා කටයුතු කිරිම සහ ශ්‍රී ලංකා රජයට අදාල වන සමුද්‍ර දූෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මුතීන් ක්‍රියාත්මක කිරිම උදෙසා අධිකාරිය වෙත පැවරි තිබුණු නෛතික බලතල ශක්තිමත් කිරිමට එවකට පැවති පනත අවලංගු කර 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණය වැලැක්වීමේ නව පනත සම්මත කරන ලදුව, එය 2009 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම පනත අනුව අධිකාරියේ නාමය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වශයෙන් වෙනස් කරන ලදී.

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ශ්‍රී ලංකාව නාවික මධ්‍යස්ථානයක් ලෙස දියුණු කිරිම එක් ප්‍රධාන අරමුණක් වේ. මෙම අරමුණ සමඟ ලංකාව වටා නව වරායන් ඉදිකිරිම, තිබෙන වරායන් වැඩිදියුණු කිරිම සිදු වේ. එයට අමතරව සාගර සම්පත් උකහා ගැනිම සඳහා වූ වැඩසටහන් සම්පාදනය කරමින් පවති. එම නිසා මෙම සංවර්ධන ක්‍රියාමාර්ග වලින් සිදුවිය හැකි දූෂණය අවම කිරිම සහ එම කර්මාන්තවල තිරසාරභාවය පවත්වාගැනිමට මෙම අධිකාරියේ දායකත්වය ලබාදිය යුතුව පවති.

මේ අනුව මෙම අධිකාරිය සමුද්‍රීය ස්භාවික සම්පත් දූෂණය අවම කිරීම, අඩු කිරිම හා පාලනය කිරිම සඳහා වූ ආයතනය ලෙස ඒ සඳහා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් පවති.

## 1.2 අධිකාරියේ වගකිම් සහ කාර්යභාරයන්

අධිකාරියේ කර්තව්‍ය

(අ) පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝග ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත කාර්යයන්ගෙන් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ කාර්යයන්ගෙන් දූෂණය විම වැළැක්වීම, අඩු කිරීම, පාලනය කිරීමේ සහ කළමනාකරණ කාර්යය සඳහා වූ යෝජනා ක්‍රමයක් සකස් කිරිම සහ ක්‍රියාවේ යෙදවීම.

(ඇ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන

දූෂණයවීම වැලැක්වීමේ, අවම කිරීමේ, පාලනය කිරීමේ හෝ කළමනාකරණය කිරීමේ කාර්ය සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන සහ රජයේ සහ පෞද්ගලික ආයතන සමඟ සහයෝගීතාවයෙන් පර්යේෂණ පැවැත්වීම.

(ඈ) ශ්‍රී ලංකා ජල තීරයේ හෝ වෙනත් යම් සමුද්‍ර කලාපවල හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපයේ යම් තෙල්, හානිකර ද්‍රව්‍ය කිසිවක් හෝ වෙනත් යම් දූෂයකයකින් දූෂණය වීම මඟහරවා කළමනාකරණය කිරීමට, සුරක්ෂිත කිරීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම.

(ඉ) යම් තෙල් වර්ග, හානිකර ද්‍රව්‍ය හෝ වෙනත් යම් දූෂක ද්‍රව්‍යයක් සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැලසීම.

(ඊ) ශ්‍රී ලංකා රජය විසින් ස්ථිර කිරීම, පිළිගැනීම, එකඟවීම හෝ අනුමත කිරීම සිදුකර ඇති හෝ සිදු කරනු ලැබිය හැකි සමුද්‍ර දූෂණය සම්බන්ධය සියලු ජාත්‍යන්තර සම්මුතීන් සහ අදාල ප්‍රොටෝකෝල පිළිගැනීම හා නිර්දේශ කිරීම.

(උ) ජාතික තෙල් දූෂණ හදිසි සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

(ඌ) ඛණිජතෙල් හෝ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්භාවික සම්පත් ගවේෂණය කිරීමේ හෝ එහි යෙදී සිටින කොන්ත්‍රාත්කරුවන්, සේවා උපකොන්ත්‍රාත්කරුවන් සහ වෙනත් තැනැත්තන්ගේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සහ පරික්ෂා කිරීම.

(එ) සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විවිධ ප්‍රජා කණ්ඩායම් අතර දැනුවත් බව ඇති කිරීම.

(ඒ) ඉහතින් වු කාර්යයන් සියල්ල හෝ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වු වෙනත් යම් සියලු ක්‍රියා හා දේ සිදුකිරීම.

## අධිකාරියේ බලතල

(අ) නැව් ආශ්‍රිත යම් කටයුත්තකින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයකින් ශ්‍රී ලංකා ජල තීරය හෝ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය ඵලදායී ලෙස සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීම.

(ආ) යම් නැව් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් හෝ වෙරළ ආශ්‍රිත සමුද්‍රයට සම්බන්ධ යම් කටයුත්තකින් උද්ගත වන යම් දූෂණයක් සම්බන්ධයෙන් පරීක්ෂණ සහ විමසීම් පැවැත්වීම සහ නඩු පැවරීම.

(ඇ) දූෂණය වැළැක්වීමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකා ජල තීරය තුළ සහ වෙනත් යම් සමුද්‍ර කලාප හෝ ශ්‍රී ලංකාවේ පෙර වෙරළ සහ වෙරළ කලාපය තුළ පවත්වාගෙන යන මුහුදු තෙල් ප්‍රවාහන කටයුතු හා බංකරින් මෙහෙයුම් සියල්ල පාලනය කිරීම.

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, මඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(ඉ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කරවීම.

(ඊ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන සියලුම ගිවිසුම්වලට කෙලින්ම හෝ තත්කාර්යය සඳහා අධිකාරිය විසින් බලය පවරන ලද යම් නිලධරයකු හෝ නියෝජිතයෙකු මඟින් එළඹීම සහ ඉටු කිරීම.

(උ) පනත යටතේ අධිකාරියට පවරන ලද බලතල සියල්ල හෝ ඉන් කිසිවක් පැවරීම සඳහා නාමයෙන් හෝ තනතුරින් යම් තැනැත්තෙකු පත් කිරීම.

(ඍ) මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් බැංකුවක හෝ මූල්‍යායතනයක ගිණුම් විවෘත කර ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

(එ) අධිකාරියේ කර්තව්‍යයන් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණය ණයට ගැනීම.

(ඒ) චංචල හා නිශ්චල දේපළ යන දෙයාකාරයෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන ප්‍රදාන, පරිත්‍යාග සහ රික්තවරණ පිළිගැනීම හා ලබා ගැනීම සහ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා ඒවා යොදා ගැනීම.

(ඔ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම.

(ඕ) අධිකාරිය මඟින් සපයනු ලබන යම් සේවාවක් සඳහා යම් තැනැත්තෙකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින් ගාස්තු අය කිරීම.

(ක) ශ්‍රී ලංකාවේ වරායවලට පැමිණෙන සියලු නැව්වලින් අධිකාරිය විසින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම සහ,


(ග) අධිකාරියේ කර්තව්‍යයන් නියමාකාරයෙන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ මේ පනතේ නිශ්චිත ලෙස සඳහන් බලතල කිසිවකට ආනුෂංගික වන්නා වූ හෝ අන්‍යාකාරයකින් අධිකාරිය මත පවරන ලද්දා වූ හෝ භාර කරන ලද්දා වූ වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

# 2.පාලන වාර්තාව

**2008 අංක 35** දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ අරමුණු පෙරදැරි කරගෙන සකස් කරන ලද 2012-2016 සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු සඳහා මඟපෙන්වීම හා ඒවා අධික්ෂණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලදී. යහපාලන මූලධර්ම අනුගමනය කිරීම මඟින් ආශ්‍රිත පාර්ශවයන් සඳහා දිර්ඝ කාලීන ප්‍රතිලාභ ලබාදීමටත්, අධිකාරිය නිසි පරිදි පවත්වාගෙන යාමටත් උපකාරී වන බව අධ්‍යක්ෂ මණ්ඩලය වැඩිදුරටත් විශ්වාස කරයි. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් දසදෙනෙකු ඇතුළත් වේ.

පාලන වාර්තාව මඟින් අධිකාරියේ සාංගමික පාලන ක්‍රියාවලිය හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදී ඇති යහපාලනය සඳහා මාර්ගෝපදේශන සංග්‍රහයේ සහ භාණ්ඩාගාරය සහ අනෙකුත් අදාල අධිකාරින් විසින් නිකුත් කර ඇති අනෙකුත් පාලන මූලධර්ම අවශ්‍යතා අනුව සකස් කර ඇත.

සාංගමික පාලන මූලධර්ම වගකීමෙන් හා විනිවිදභාවයකින් යුක්තව අනුගමනය කරන බව තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය කරන අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය දිනෙන් දිනම යොමු විය. අභ්‍යන්තර පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි උප කමිටුව වන විගණන කළමනාකරණ කමිටුව හා සුදුසුකම් සහිත ඉහළ කළමනාකරණ මණ්ඩලයකින් යුක්ත වේ. පහත පෙන්වා දි ඇති සාංගමික පාලන ව්‍යුහය මඟින් අභ්‍යන්තර පාලන ඒකක ප්‍රතිසංවිධාන ක්‍රියාවලින් හා ක්‍රමවේද හරහා ඵලදායිව භාවිතා කරන ආකාරය දක්වා ඇත.




**2.1** අධ්‍යක්ෂ මණ්ඩල වගකීම හා කාර්යභාරය

සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා තමන් තුළ වූ කුසලතා හා තීරණ ගැනීමේ හැකියාවන් උපරිම වශයෙන් ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ඇගයීමේදි භාවිතා කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීමක් වේ. දිර්ඝ කාලීන අරමුණු ලඟාකර ගැනීම හා ඊට අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයයි. මෙම ක්‍රියාකාරකම් ඉටුකිරීමේදි අවශ්‍ය අවස්ථාවේ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් තාක්ෂණික හා උපදේශන සේවා ලබාගැනීමට ද සිදුවිය.


අධිකාරියේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඇස්තමේන්තුව මඟින් ලඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ලඟාකර ගැනීම සඳහා යහපාලන මූලධර්ම භාවිතා කරමින් කටයුතු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ඵලදායී හා කාර්යක්ෂම ලෙස කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු ඉටුකිරීම සඳහා ස්වාධින ව විමසුම් කිරීම හා අධීක්ෂණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපකමිටුවක් ලෙස විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. මෙම

කමිටුව මූලික වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. විගණන හා කළමනාකරණ කමිටුවේ වගකීම හා කාර්යභාරය මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

**2.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

**2014.12.31** දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය අධ්‍යක්ෂවරුන් **10** දෙනෙකි. එයින් **8** දෙනෙකු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර සභාපති හා සාමාන්‍යාධිකාරී පමණක් විධායක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලබයි.




රූප සටහන් 01

ටී. එන්. විජේගුණවර්ධන මහතා සභාපතිවරයා වශයෙන් කටයුතු කල අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු ක්‍රමානුකූලව සිදුකිරීමට හා මනාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් හා මඟපෙන්වීම් ඔහු විසින් සලස්වන ලදී.

විධායක හා විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය **2008** අංක **35** දරණ සමුද්‍ර දූෂණ වැලැක්වීමේ පනතේ දක්වා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව වසර තුළදී පවත්වාගෙන යන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් **6** දෙනෙකුම ප්‍රධාන අමාත්‍යාංශ හතරක හා නාවික හමුදාපති, අධ්‍යක්ෂ ජෙනරාල්, වෙළඳ නෞකා දෙපාර්තමේන්තුව නියෝජනය කරනු ලබයි. ඒ අනුව අධිකාරියට අයත් සියලුම විෂය පරාසයන් ආවරණය වන පරිදි විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්ව ඇති අතර එම ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමේදි මෙම විධායක නොවන අධ්‍යක්ෂවරු විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

**2.3 අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම හා විශ්‍රාමයාම්**

සමාලෝචිත **2014** මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් දෙකක් සිදුකරන ලද අතර එක් විශ්‍රාම ගැනීමක් සිදු වී ඇත.

**2.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්**

**2014** වර්ෂය තුළදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් **14** ක් පවත්වා ඇත. වඩාත් ඵලදායී හා කාර්යක්ෂම තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා හා අවශ්‍ය කරන අනෙකුත් තොරතුරු කල්වේලා ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යැවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

**2.4 අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නීති කළමනාකරු අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේඛණ පවත්වාගෙන යාමට අමතරව යහපාලන මූලධර්ම, නෛතික අවශ්‍යතා අනුගතවෙමින් වඩාත් කාර්යක්ෂමව හා කළමනාකරණය කරගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය කරන තොරතුරු කාලීනව හා නිවැරදිව සැපයීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සිදු කරන ලදී.

# 3.විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරු තුන්දෙනෙකුගෙන් සමන්විත වේ. එහි සභාපතිත්වය හා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන එම්.එස් පී.ජයතිලක මහතා විසින් දැරූ අතර පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආර්.ආර්.ඒ.ආර්.රූපසිංහ හා පත්කල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ජේ.ඒ.ඒ.එස්.රණසිංහ යන මහත්වරුන් කමිටු සාමාජිකයන් විය. ඊට අමතරව විගණකාධිපති දෙපාර්තමේනතුවේ පරිසර අමාත්‍යාංශයභාර විගණන අධිකාරී සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක,ප්‍රධාන නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී විය. විගණන හා කළමනාකරණ කමිටුවේ කැඳවීම මත සාමාන්‍යාධිකාරී සහ ගණකාධිකාරී සහ අනෙකුත් අදාල තනතුරු දරණ නිලධාරීන් අවශ්‍ය අවස්ථාවලදී කමිටුව ඉදිරියේ පෙනී සිටිමින් අදාල කරුණු පැහැදිලි කිරීම් සිදුකරන ලදී.

අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලදී. විගණනයේ විෂය පථය විශේෂයෙන් අවධානය යොමුකල යුතු මෙහෙයුම්,මූල්‍ය,පරිපාලන හා නීති අංශ ආවරණය වන පරිදි වසර තුළ ක්‍රියාත්මක වන ආකාරයට සැලසුම් කර ඇත. ඊට අමතරව විගණකාධිපති දෙපාර්තමේන්තුව මඟින් මූල්‍ය ප්‍රකාශන විගණනයට සාමාන්තරව මෙහෙයුම්,පරිපාලන හා මූල්‍ය අංශවල දුර්වලතා හා අභ්‍යන්තර පාලන ක්‍රමවල පවත්නා අඩුපාඩු ඇගයීමට ලක් කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණය සමඟ සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීය. අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා අනෙකුත් රෙගුලාසිවල දක්වා ඇති පරිදි අධිකාරියේ කටයුතු සිදු කරනු ලබන බවට තහවුරුවක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කොට ක්‍රියාත්මක කරනු ලැබීය. මෙහිදී අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම්, අධිකාරියේ වත්කම් ආරක්ෂා කිරීම හා නඩත්තුව, ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවය පවත්වාගෙන යාම ඇතුළු සියලුම මූල්‍ය,පරිපාලන හා මෙහෙයුම් ක්‍රියාකාරකම් විගණනයට භාජනය විය. විගණන හා කළමනාකරණ කමිටුව විසින් ගණකාධිකාරීවරයා විසින් සකස් කර ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රගති වාර්තා පරික්ෂා කර බලා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරීතුමා වෙත අවශ්‍ය කරන නිර්දේශ ලබාදෙන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ ඔවුන්ගේ නිරීක්ෂණ, නිගමන හා නිර්දේශ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලදී. ඊට අතිරේකව විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා වලින් අනාවරණය කරගත් කරුණු හා විගණන ක්‍රමවේදවල ඵලදායීතාවය ඇගයීමට ලක්කල අතර එහිදී අඩුපාඩු අවම කරගැනීමට අවශ්‍ය කරන උපදෙස් හා මඟපෙන්වීම් අභ්‍යන්තර විගණන අංශයට ලබාදෙන ලදී. වසර තුළදී විගණන හා කළමනාකරණ කමිටුව හතර වතාවක් රැස්වීම් සිදුකරන ලදී.

## 2014 වර්ෂය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ වාර්තා

| | නම | අධ්‍යක්ෂ මණ්ඩලයේ දරන තනතුර | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් |
|---|---|---|---|
| 01 | ටී.එන්. විජේගුණවර්ධන මහතා | සභාපති (අමාත්‍යාංශයෙන් පත්කල සාමාජික)- විධායක අධ්‍යක්ෂ | - |
| 02 | ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 8/14 |
| 03 | එස්. එන්. මයාදුන්නේ බණ්ඩාර මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 3/14 |
| 04 | පී.එම්.එස්.ජයතිලක මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 14/14 |
| 05 | එච්.එම්.බී.සී.හේරත් මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 7/14 |
| 06 | ඒ.ඩබ්.සෙනෙවිරත්න මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 5/14 |
| 07 | කොමදෝරු එන්.පී.ආටිගල මහතා (අස්වීම 21.03.2014 ) | විධායක නොවන අධ්‍යක්ෂ | 2/14 |
| 08 | කොමදෝරු එන්.පී.වික්‍රමසිංහ මහතා(පත්වීම- 19.05.2014) | විධායක නොවන අධ්‍යක්ෂ | 7/14 |
| 09 | ජේ.ඒ.ඒ.එස්.රණසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ (අමාත්‍යාංශයෙන් පත්කල සාමාජික) | 14/14 |
| 10 | එම්. කටුලන්ද මහතා | විධායක නොවන අධ්‍යක්ෂ (අමාත්‍යාංශයෙන් පත්කල සාමාජික) | 2/14 |
| 11 | ඒ.කාරියවසම් මෙනෙවිය(04.08.2014 දිනට) | සාමාන්‍යාධිකාරී (වැ.බ.) විධායක අධ්‍යක්ෂ | - |
| 12 | පී.බී.ටර්නි ප්‍රදීප් කුමාර මහතා (පත්කල දිනය 04.08.2014) | සාමාන්‍යාධිකාරී විධායක අධ්‍යක්ෂ | - |
| 13 | ජී.එස්.එස්.ජී.පෙරේරා | නිරීක්ෂක(විගණන හා කළමනාකරණ කමිටුව) | 0 |
| 14 | එල්.ඩී.එන්.කුමාරසිරි | නිරීක්ෂක(විගණන හා කළමනාකරණ කමිටුව) | 0 |

## 2014 වර්ෂය තුළ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ විගණන හා කළමනාකරණ රැස්වීම් පිළිබඳ වාර්තා

| | නම | අධ්‍යක්ෂ මණ්ඩලයේ දරන තනතුර | විගණන හා කළමනාකරණ රැස්වීම් |
|---|---|---|---|
| 01 | ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 3/4 |
| 02 | පී.එම්.එස්.ජයතිලක මහතා | විධායක නොවන අධ්‍යක්ෂ | 4/4 |
| 03 | ජේ.ඒ.ඒ.එස්.රණසිංහ මහතා | විධායක නොවන අධ්‍යක්ෂ (අමාත්‍යාංශයෙන් පත්කල සාමාජික) | 4/4 |
| 04 | ජී.එස්.එස්.ජී.පෙරේරා | නිරීක්ෂක(විගණන හා කළමනාකරණ කමිටුව) | 4/4 |
| 05 | එල්.ඩී.එන්.කුමාරසිරි | නිරීක්ෂක(විගණන හා කළමනාකරණ කමිටුව) | ¾ |

# 4. මෙහෙයුම් පිළිබඳ සමාලෝචනය

1. **ජාතික තෙල් විසිරිමේ සැලැස්ම ක්‍රියාත්මක කිරිම**

ශ්‍රී ලංකාවේ වාණිජ හා ධීවර වරායන් සංඛ්‍යාව වැඩිවීමත්, වරාය ආශ්‍රිත සංවර්ධන කටයුතු නිසාත් ශ්‍රී ලංකාවට පැමිණෙන නෞකා සංඛ්‍යාව වැඩිවීමත් සමඟම නෞකා අනතුරු මගින් පරිසරයට තෙල් එකතුවීමට ඇති අවධානම වැඩි වෙමින් පවති.

එලෙස හදිසි තෙල් විසිරිමක් සිදුවුවහොත් එමගින් සිදුවන හානි වැලැක්වීම සහ අඩුකිරිම සඳහා තෙල් විසිරිම පාලනය සඳහා වූ තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම ක්‍රියාවට නැගීම අවශ්‍ය වේ.

එම සැලැස්ම ක්‍රියාත්මක කිරිම සඳහා එම සැලැස්ම සමග සම්බන්ධ සියලු ආයතන හා නිලධාරින් දැනුවත් කොට එම සැලැස්මට අනුව පියවර ගැනිම ඉතා වැදගත් වේ. ඒ සඳහා අධිකාරිය මගින් 2014 වර්ෂයේ පහත ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

- සිද්ධි විධාන කණ්ඩායම් රැස්වීම පැවැත්වීම. (Incident Management Team)

හදිසි තෙල් විසිරිමකදී එම සැලැස්ම ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය සිද්ධි ක්‍රියාකාරී සැලැස්ම (Incident Action Plan) සැදීමේ මූලික වගකිම පැවරනු ලබන්නේ මෙම කණ්ඩායමට වන අතර පවරා ඇති වගකිම අනුව ඔවුන් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරිම අවශ්‍ය වේ. ඒ සඳහා 2014 වර්ෂය තුළදි රැස්වීම් වාර 5 ක් පවත්වා එම කණ්ඩායම දැනුවත් කරන ලදි. එමෙන්ම එහිදි එම නිලධාරින් අයත් ආයතනවල වගකීම පිළිබඳ සාකච්ඡා කරන ලදි.

- තෙල් විසිරිමකදි ප්‍රතිචාර දක්වන්නන් පුහුණු කිරම සඳහා වු තුන්දින පුහුණු වැඩසටහන

තෙල් විසිරිමට ප්‍රතිචාර දැක්විම සඳහා පලමු ප්‍රතිචාර දක්වන්නන් සඳහා, තෙල් විසිරිමේ බලපෑම, තෙල් විසිරිමේදි එය පාලනය සඳහා භාවිතා කලයුතු තාක්ෂණික කටයුතු පිළිබඳ හා තෙල් විසිරිම පාලනය සඳහා ඇති උපකරණ ඒවා ක්‍රියාකරවිම පිළිබඳව දැනුවත් කිරීම සඳහා තෙදින වැඩමුළු පවත්වන ලදී.

- දකුණු ආසියානු කලාපය තුළ තෙල් විසිරීමකදි ක්‍රියාත්මක සැලැස්ම සඳහා සම්බන්ධ වීම.

දකුණු ආසියානු කලාපය තුළ තෙල් විසිරිමකදි දකුණු ආසියානු රටවල් වන ඉන්දියාව,බංගලාදේශය, පකිස්ථානය, මාලදිවයින හා ශ්‍රී ලංකාව යන රටවලට බලපෑම් ඇතිකරන තෙල් විසිරිමක් සිදුවුවහොත් එක්ව එයට ප්‍රතිචාර දැක්විම සඳහා සැලැස්මක් සකස් කර ඇති අතර එය හදිසි තෙල් විසිරිමකදි ක්‍රියාත්මක කිරිම සඳහා ඉහත රටවල් සමඟ අවබෝධතා සිහිපතක් අත්සන් කල යුතුය. මෙම අවබෝධතා සිහිපත සඳහා ශ්‍රී ලංකාව අත්සන් තැබිමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. එම සිහිපත සඳහා පරිසර අමාත්‍යවරයා අත්සන් තැබිමෙන් පසු ශ්‍රී ලංකාව එම අවබෝධතා සිහිපත අනුව කටයුතු කිරිම සිදු කල යුතුය.

අන්තර්ජාතික සමුද්‍රිය සංවිධාන මගින් දකුණු ආසියානු කලාපයේ ඉහත සැලැස්ම ක්‍රියාත්මක කිරිම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන අතර ඒ යටතේ දකුණු ආසියානු කලාපිය පරිසර සහයෝගිතා වැඩසටහන සමඟ එක්ව හදිසි තෙල් විසිරිමකදි ක්‍රියාත්මක සැලැස්ම ක්‍රියාවට නැංවිම පිළිබඳ දෙදින වැඩමුළුවක් පවත්වන

ලදි. එහිදි ජාතික තෙල් විසිරිමකදි ක්‍රියාත්මක සැලැස්ම වැඩි දියුණු කිරිම සඳහා වු නිර්දේශ හා දකුණු ආසියානු සැලැස්ම වැඩිදියුණු කිරිම සඳහා වු නිර්දේශ ඉදිරිපත් කිරිමද සිදු කරන ලදි.

- පලාත් මට්ටමේ තෙල් විසිරිමේ සැලැස්මක් හඳුන්වාදීම.

තෙල් විසිරිමකදි ක්‍රියාත්මක විම සඳහා පලාත් මට්ටමේ සැලැස්මක් සෑදිම සඳහා වු අවශ්‍ය කටයුතු ඇරඹීම සඳහා දෙදින වැඩමුළුවක් පවත්වන ලදී.

- කළුතර කැලිඩෝ වෙරළ තිරය තෙල් මගින් දූෂණය විම.

2014.02.01 දින කළුතර කැලිඩෝ වෙරළ තිරයේ තෙල් මගින් දූෂණය විමේ සිදුවිමක් වාර්තා වු අතර එමගින් කළුතර වෙරළ තීරයේ කිලෝ මිටර 2 කට ආසන්න ප්‍රදේශයක් දූෂණය වි පැවතිණි. එහිදි අප ආයතනයේ නිලධාරින්, වෙරළ ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමඟ එකතු වි වෙරළ තිරයේ රැඳී තිබු තෙල් ඉවත් කොට පිරිසිදු කිරීම සිදු කරන ලදි. එසේම තෙල් විසිරිම සිදුවු ප්‍රභවය සොයාගන්නා ලද අතර ඒ අනුව අදාළ ආයතනයට විරුද්ධව නීතිමය කටයුතු සිදුකිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

- සමුද්‍ර දූෂණය වැලැක්විම සඳහා ඇති අන්තර්ජාතික සම්මුතිය සඳහා පාර්ශවකරුවෙකු විම.

සමුද්‍ර දූෂණය වැලැක්විම සඳහා ඇති අන්තර්ජාතික සම්මුතිය මත නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්විම සඳහා වන 1973/78 සම්මුතියේ නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්විම සඳහා වන සංවිධානය 1997 OPRC HNS Protocol සඳහා ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු විම සඳහා දත්ත නිර්ණය සඳහා වු ශ්‍රී ලංකා තත්ත්ව විශ්ලේෂණ වාර්තා කෙටුම්පත් කර අදාල ආයතන සමග සාකච්ඡා කර ඒවා සම්පුර්ණ කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

- බිලාස්ට් ජලය ඔස්සේ පැමිණෙන ආක්‍රමණික ජීවින් පැතිරයාම කළමනාකරණ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ ඇති වාණිජ වරායන් වල මෙම තත්ත්වය පිළිබඳ මුලික පර්යේෂණ සිදු කිරිම එක් කටයුත්තක් වු අතර 2014 වර්ෂය තුලදි ත්‍රිකුණාමලය, ගාල්ල, හම්බන්තොට යන වරායන් වල මෙම සමික්ෂණ කටයුතු අවසන් කරන ලදි.

එමෙන් ම ශ්‍රී ලංකාවට පැමිණෙන නෞකා මගින් බිලාස්ට් ජලය ඉවත්ලිම පිළිබඳ වාර්තා ලබාගැනිම සඳහා බිලාස්ට් ජලය ඉවතලෑම පිළිබඳ අන්තර්ජාලය ඔස්සේ දැනුම් දිය හැකි ක්‍රමයක් ICTA ආයතනය සමග එක්ව සාදන ලදි.

- හරිත ධිවර වරාය ව්‍යාපෘතිය.

ධිවර වරායන් වල කටයුතු හේතුවෙන් සිදුවන සමුද්‍ර දූෂණය වලක්වා ධිවර වරායන්වල තත්ත්වය වැඩිදියුණු කිරිම උදෙසා නියමු ව්‍යාපෘතින් ලෙස මිරිස්ස ධිවර වරාය කේන්ද්‍ර කර ගනිමින් ඉහත ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ ධිවර වරායන් තුළ අධික ලෙස එකතු වන ඝන අපද්‍රව්‍ය වන ෆයිබර් ග්ලාස්, පොලිතින්, රිජිපෝම් වැනි ඝන අපද්‍රව්‍ය නිවැරදිව එකතු කොට අපහරණය කිරිම, ධිවර වරායන්වල මාළු වෙළදාම් කරන ස්ථානවල එකතුන අපද්‍රව්‍ය නිවැරදිව එකතු කිරිම හා අපහරණය කිරිම, අපජලය නිවැරදිව එකතු කොට පිරිපහදු කිරිම සඳහා පිරිපහදු පද්ධතියක් ඇති කිරිම ප්‍රධාන කටයුතු වේ.

2014 අවුරුද්ද තුළ ධිවර වරාය මාළු වෙළදාම් කල කොටසින් එකතු වන අපද්‍රව්‍ය වරාය තුළට වැටිම වැලැක්විමට හා ඒවා එකතු කිරිම සඳහා වු වැඩපිළිවෙල යටතේ නව මත්ස්‍ය වෙළදාම්

ස්ථානයක් ඇතිකොට අපද්‍රව්‍ය එකතු කිරිම සඳහා වු වැඩපිලිවෙලක් ආරම්භ කරන ලදි.

- මුහුදට අපද්‍රව්‍ය මුදා හැරිම සඳහා බලපත්‍ර නිකුත් කිරිම.

අධිකාරිය මඟින් සකස් කරන ලද රෙගුලාසි අනුව මුහුදට අපද්‍රව්‍ය දැම්මේදී අධිකාරිය විසින් ලබාගත් බලපත්‍රයක් ඇතුව පමණක් සිදු කල යුතුය. එමෙන්ම මුහුදට අපද්‍රව්‍ය දැම්ම සඳහා වු රෙගුලාසි වල කොන්දේසි වලට අනුකූලව පමණක් මුහුදට අපද්‍රව්‍ය බැහැර කිරිම සිදුකල යුතුය. එමගින් සමුද්‍රයට මුදාහරිනු ලබන හානිකර අපද්‍රව්‍ය ප්‍රමාණය සිමා කල හැකි අතර, අපද්‍රව්‍ය දැම්ම තුළින් සාගර පරිසරයට වන බලපෑම මෙන්ම සමුද්‍ර ආශ්‍රිත කර්මාන්ත වලට වන බලපෑම ද අවම කල හැක.


**<u>නැව් වල ජනනය වන අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම.</u>**


මෙම ක්‍රියාකාරකම් යටතේ නැව් වල ජනනය වන අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරිමට අවශ්‍ය නව ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කර තිබිණ. එහිදි අන්තර්ජාල පහසුකම් භාවිතයෙන් අපද්‍රව්‍ය ඉවත්කිරිමේ සේවාව විධිමත්ව කරගෙන යාමට කටයුතු කරන ලදි. නමුත් නව ක්‍රියාමාර්ග ගැනිමේදි ඇතිවුනු සමහර ගැටලුකාරි තත්ත්වයන් මගහරවා ගැනිමට සේවා සපයන ආයතනවලින් කරන ලද ඉල්ලිම් ද සලකා බලා නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරිම අවස්ථා කිහිපයකදි කල් දැම්ම සිදු වු අතර පැරණි ක්‍රමවේදයටම සේවාව සැපයිම 2014 වර්ෂය තුළදී සිදුවිය.


2014 වර්ෂය සඳහා සේවා සපයන ආයතන 27 ක් ලියාපදිංචි කරගන්නා ලදි.

1. හොල්සිම් (ලංකා) ලිමිටඩ්
2. ශානිකා මරයින් කම්පැනි
3. ජායා මැරයින් කම්පැනි
4. ජී. එම්. ලයින්
5. විස්මිත මරයින් එන්ට(ර්)ප්‍රයිසස්
6. ප්‍රබල ට්‍රේඩ(ර්)ස් මරයින් ස(ර්)විස්
7. එස්. එච්. විල්සන් ඇන්ඩ් කම්පැනි
8. මරියා ශිපින් ස(ර්)විස්
9. ඕෂන් මරයින් සර්(වි)ස්
10. එන්.ජී.එන්.රන්ජිත් මරයින් ස(ර්)විස්
11. නිව් කොලම්බු හාබ(ර්) සප්ලය(ර්)
12. මල්ෂා ග්ලෝබ් ශිපින් ස(ර්)විස්
13. ලක්ෂ්මන් ට්‍රේඩ(ර්)ස් ඇන්ඩ් කන්ට්‍රැක්ස්
14. කේ. එල්. එස්. මරයින් ස(ර්)විස්
15. යුනයිටඩ් ඔෂනික් මරයින් ස(ර්)විසස්
16. මැරිනෝ ලංකා
17. සුදේශ් එන්ට(ර්)ප්‍රයිසස් ඇන්ඩ් එක්ස්පෝට(ර්)ස්
18. සාගර මැරයින් ඇන්ඩ් එන්ජිනියරින් ස(ර්)විස්
19. තරුනි මැරයින් ස(ර්)විස්
20. නිරොෂ් මැරයින් ස(ර්)විසස්
21. කේ. එල්. ගුනසිරි ඇන්ඩ් සන්ස්
22. සන්කෙම් ඉන්ඩස්ට්‍රිස්
23. සුධා ශිපින් ස(ර්)විස්
24. කොළඹ ඩොක්යාර්ඩ් පී. එල්. සී.
25. දෙව් එන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
26. කැනඩියන් ස්ටා(ර්) (ප්‍රයිවට්) ලිමිටඩ්
27. සුප්‍රීම් පෙට්(රෝ) ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2014 වර්ෂය තුළදී නෞකා 1159 ක් සඳහා අපද්‍රව්‍ය ඉවත් කිරිමේ සේවා සපයා ඇති අතර එමගින් දැවි තෙල් මෙට්‍රික් ටොන් 19531 ක් සහ ඝන අපද්‍රව්‍ය කියුබික් මිටර 6645 ක් ඉවත් කර නිසි පරිදි අපහරණය සිදුකර ඇත.






2014 වර්ෂයේදි ලියාපදිංචි කිරිමේ ගාස්තු සහ බලපත්‍ර නිකුත් කිරිම මගින් උපයන ලද මුළු ආදායම රුපියල් 9,915,150.00 වේ.

**<u>බංකරින් බලපත්‍ර කිතුත් කිරිම.</u>**

2014 වර්ෂයේදි බංකරින් තෙල් සපයන නෞකා 10 කට සමුද්‍ර පරිසර ආරක්ෂණ බංකරින් බලපත්‍ර නිකුත් කරන ලදි. ප්‍රධාන වශයෙන් නෞකා වලට බංකර් ඉන්ධන සැපයිම කොළඹ වරායේ සිදුකරනු ලැබු අතර ඊට අමතරව හම්බන්තොට, මාගම්පුර වරායෙන් ද බංකර් ඉන්ධන සැපයීම සිදුකිරිමට අදාලව නෞකා වලට බලපත්‍ර ලබා දෙන ලදි.


බංකර් බලපත්‍ර නිකුත් කරන ලද නෞකා

1. MT SHERMAC
2. MT SEA FALCON
3. MT WEALTHY
4. MT LM KELANI
5. MT MADURU OYA
6. MT LM NILWALA
7. LMS DIYALUMA
8. LSM LAXAPANA
9. LMS DUNHIDA

ඊට අතිරේකව ත්‍රිකුණාමලයේ ලංකා අයි. ඕ. සී. ආයතනය (IOC) සහ මාගම්පුර Port Management Company යන ආයතන විසින් ගොඩබිම තෙල් ගබඩා කිරිමේ පහසුකම් පවත්වාගෙන යෑම වෙනුවෙන් බංකර් බලපත්‍ර ලබාගන්නා ලදි.

එසේම ජයසුන්දර මෝට(ර්)ස් ආයතනය බව්සර් මගින් බංකර් තෙල් සැපයිමට අදාලව Road Tunker clearance certificates 10 ක් ලබා ගන්නා ලදි.

බංකර් බලපත්‍ර නිකුත් කිරිම මගින් 2014 වර්ෂයේදි උපයන ලද සම්පුර්ණ ආදායම රුපියල් 1,729,000.00 විය.



**<u>ජගත් පරිසර දින සහ ජගත් සාගර දින සැමරීමේ වැඩසටහන - 2014</u>**

සමුද්‍ර පරිසරයෙහි වැදගත්කම පිළිබඳව ලෝක ප්‍රජාව දැනුවත් කිරිමේ අරමුණ පෙරදැරි කරගෙන එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් 2009 වසරේ සිට සෑම වසරකම ජගත් සාගර දිනය සැමරිම සඳහා ජුනි සම 08 වන දින නම් කර ඇත. මෙවර විශේෂත්වය වන්නේ ජුනි 08 දිනට යෙදෙන ජගත් සාගර දිනය සහ ජුනි 05 දිනට යෙදෙන ජගත් පරිසර දින වැඩසටහන් ඒකාබද්ධව සිදුකිරිමට කටයුතු කිරිමයි.

ඒ අනුව මෙම ඒකාබද්ධ ජගත් සාගර දින සහ ජගත් පරිසර දිනය සැමරිම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් වැඩසටහන් මාලාවක් දියත් කරන ලදි. ජාතික වැඩසටහන පරිසර හා පුනර්ජනනීය බලශක්ති ගරු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2014 ජුනි මස 16 වන දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලිය ශ්‍රවණාගාරයේ දි පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා රාජ්‍ය නිලධාරින්, විශ්ව විද්‍යාලීය සිසුන්, පාසල් සිසුන්, කර්මාන්ත හිමිකරුවන්, හෝටල් හිමියන්, ව්‍යාපාරිකයන් සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින්ගෙන් යුත් 250 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් පැවත්විණ.

මෙම වැඩමුළුවේදි ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සාගර පරිසරයේ වැදගත්කම, එය තිරසාර ලෙස පවත්වාගැනිමත්, සාගර පරිසරය දූෂණයෙන් තොරව පවත්වාගැනීම පිළිබඳවත් දේශන මාලාවක් පැවැත්විණ. මෙහිදි ප්‍රධාන ආරාධිත දේශනය මොරටුව විශ්ව විද්‍යාලයේ ජොෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මහේෂ් ජයවිර මහතා විසින් ද සෙසු දේශන කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය දේවක විරකෝන්, රුහුණු විශ්ව විද්‍යාලයේ සාගර හා සාගර භූ විද්‍යා අංශයේ අංශ ප්‍රධානී ආචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ජෛව විවිධත්ව ලේකම් ඩි.එම්.මනෝජ් මහතා විසින් සිදුකරන ලදී.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන සත් සමුදුර සාර සංග්‍රහය එළි දැක්විම ද පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එදින සිදුවිය.

මෙම වැඩසටහනට සමගාමීව එදිනම ගරු පාරිසරික හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ත්‍රිකුණාමලය සල්ලි වෙරළ තිරයේ දි කඩොලාන පැල 2500 ක් රෝපණය කිරිමේ වැඩසටහනේ සමාරම්භය පැල 500 ක් රෝපණය කරමින් ආරම්භ කරන ලදී. මේ සඳහා නාවික හමුදාව, රාජ්‍ය නිලධාරින් සහ රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරින් 100 දෙනෙකු පමණ සහභාගි විය.

2014 ජුනි 15 වන දින කිමිදුම්කරුවන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පරෙවි දූපත ආශ්‍රිතව කොරල් පරය ප්‍රදේශ 02 කදි පිරිසිදු කිරිමේ වැඩසටහනක්ද ජගත් පරිසර දින සහ ජගත් සාගර දින වැඩසටහනට සමගාමීව සිදුකරන ලදි.

මීට අමතරව අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල මගින් කොළඹ, මීගමුව, කළුතර, හලාවත, ගාල්ල,මාතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්වල තෝරාගත් ධිවර වරායන් 09 ක් සහ දෙහිවල වෙරළ තිරය පිරිසිදු කිරිම ජගත් පරිසර දින සහ ජගත් සාගර දින වැඩසටහනට සමගාමීව ජුනි මස තුළ සිදුකරන ලදී.

ධිවර වරායන්හි පවිත්‍රකිරිමේ වැඩසටහනට සහභාගි වු අනෙකුත් ආයතන වලට නාවික හමුදාව, වෙරළ ආරක්ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, ධිවර වරාය නීතිගත සංස්ථාව, පොලීසිය, ධිවරයන් , ප්‍රාදේශිය සභා , වරාය අධිකාරිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් සහ රාජ්‍ය නොවන සංවිධාන අයත් වේ.

මෙම වැඩසටහනේදී බෝතල්, පොලිතීන්, නයිලෝන්, රබර්, යකඩ, ප්ලාස්ටික්. රෙදි, වීදුරු වැනි දිරා නොයන අප ද්‍රව්‍ය සහ කාබනික අපද්‍රව්‍ය රැස්කර ගන්නා ලද අතර අදාල ස්ථානවල පිහිටා ඇති ප්‍රාදේශිය සභා හා නගර සභා විසින් මෙම අපද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය සහය ලබා දෙන ලදී.

ධීවර වරායන් පිරිසිදු කිරීමේ වැඩසටහන පැවැත්වූ දිනයන්, ස්ථානයන් හා සහභාගීත්ව සංඛ්‍යාව පහත පරිදි වේ.

**මිරිස්ස ධීවර වරාය පිරිසිදු කිරිම**





| දිස්ත්‍රික්කය | දිනය හා ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| හම්බන්තොට | 20.06.2014 දින කිරින්ද ධිවර වරාය | 51 |
| මාතර | 05.06.2014 දින මිරිස්ස ධිවර වරාය | 64 |
| ගාල්ල | 06.06.2014 දින හික්කඩුව ධිවර වරාය | 61 |
| කොළඹ | 19.06.2014 දින දෙහිවල වෙරළ | 53 |
| මීගමුව | 10.06.2014 දින දික්ඕවිට ධිවර වරාය | 125 |
| හලාවත | 24.06.2014 දින කල්පිටිය ධිවර වරාය | 50 |
| කළුතර | 11.06.2014 දින බේරුවල ධිවර වරාය | 50 |
| ත්‍රිකුණාමලය | 22.07.2014 දින කොඩ් ධිවර වරාය | |
| අම්පාර | 08.07.2014 දින ඔලු විල් ධිවර වරාය | 70 |

## කිරින්ද ධීවර වරාය පිරිසිදු කිරීම





## හික්කඩුව ධීවර වරාය පිරසිදු කිරීම





## කොළඹ දෙහිවල වෙරළ තීරය පිරිසිදු කිරීම





**අන්තර්ජාතික වෙරළ පවිත්‍ර කිරිමේ වැඩසටහන 2014**

පෘථිවි ජෛව ගෝලයේ විශාලතම පරිසර පද්ධතිය සාගරයයි. මිනිසා විසින් සිදුකරනු ලබන විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් සාගර පරසරය ආශ්‍රිතව එක් රැස්වන අපද්‍රව්‍ය ප්‍රමාණය දිනෙන් දින ඉහළ යමින් පවතී. මේ හේතුවෙන් සමුද්‍ර පරිසරයට , සාගර ජීවින්ට, සාගර පරිසර පද්ධතිවලට එල්ලවන බලපෑම්ද ඉහළ යමින් පවති. මේ අනුව සෑම වසරකම සැප්තැම්බර් මස තෙවන සතියේ යෙදෙන සෙනසුරාදා දිනය අන්තර්ජාතික වෙරළ පවිත්‍ර කිරිමේ දිනය ලෙස ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මේ අනුව සෑම වසරකම යෙදෙන මෙම දිනයෙහි ලොව වටා සිටින ජනතාව වෙරළ තීරයන් හා ජල මුලාශ්‍ර වල එකතු වි ඇති අපද්‍රව්‍ය එක් රැස්කර ඒවා පිළිබඳ දත්ත සටහන් කර ඉවත් කිරිම සිදුකරන ලබන අතර එක් එක් රටවලින් රැස් කරගන්නා දත්ත පදනම් කරගෙන අන්තර්ජාතික වශයෙන් අපද්‍රව්‍ය පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාව ආශ්‍රිතව කි. මි. 1700 ක මුහුදු තීරයේ තෝරා ගත් ස්ථාන මෙම වසරේද පවිත්‍ර කිරිමෙන් ලෝක දත්ත අතරට අප රටේ සහයෝගය ලබාදිම සහ සමුද්‍රීය පරිසරයේ වටිනාකම පිළිබඳව හා එය රැක ගැනිමේ අරමුණ ජනතාව අතරට ගෙනයාම පෙරටු කොට ගත් අන්තර්ජාතික වෙරළ පවිත්‍රතා දිනය සැමරීම පෙර වසරවල මෙන්ම මෙවරද අප අධිකාරිය වීසින් සිදුකරන ලදි. ඒ අනුව 2014 ජාතික වැඩසටහන ගල්කිස්ස වෙරළ තිරයේදි සැප්තැම්බර් මස 20 වන දින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරින්. විශ්ව විද්‍යාල සිසුන් හා පාසල් සිසුන්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව සිදුකරන ලදී. මීට අමතරව පුත්තලම, ගාල්ල, මාතර, හම්බන්තොට, ත්‍රිකුණාමලය, යාපනය, කලුතර, මීගමුව, මට්ටක්කුලිය යන දිස්ත්‍රික්කවල තෝරා ගත් වෙරළ තීරයන් ද මෙම වැඩසටහන යටතේ පවිත්‍ර කරන ලදී. එසේම ත්‍රිකුණාමලය ප්‍රාදේශිය කාර්යාලය මගින් සංවිධානය කරන ලද කොරල්පර පවිත්‍ර කිරිමේ වැඩසටහනක් ද ත්‍රිකුණාමලය පරවි දූපත ආශ්‍රිතව අන්තර්ජාතික වෙරළ පවිත්‍රකිරිමේ වැඩසටහනට සමගාමීව සිදුකරන ලදි.

# 5 පරිපාලන, නීති, මානව සම්පත් සංවර්ධන, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය අංශවල සේවය සහ වගකීම.

5.1 පරිපාලන අංශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්යය මණ්ඩලය සේවයේ ස්ථාපිත කිරීමේ සිට සේවය අවසන් කිරීම දක්වා සමස්ථ පිරිස් කළමනාකරණ කාර්යයද අධිකාරියේ සෙසු අංශවල ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සම්පාදනයද පරිපාලන අංශයේ වගකීම වේ. අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වන සාමාන්‍යාධිකාරිවරයාගේ මහපෙන්වීම යටතේ පරිපාලන අංශය කටයුතු කරනු ලබයි.

2014.12.31 දිනට අධිකාරියේ කාර්යමණ්ඩලය සඳහා පුරප්පාඩු

| සේවක ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ප්‍රධන විධායක නිලධාරි | 01 | 01 | - |
| ජ්‍යේෂ්ඨ කළමනාකරුවන් | 04 | 02 | 02 |
| මධ්‍යම කළමනාකරුවන් | 12 | 09 | 03 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 16 | 09 | 07 |
| බලාත්මක කිරීමනිලධාරීන් | 38 | 26 | 12 |
| කළමනාකරණ සහකාර තාක්ෂණික සහ තාක්ෂණික නොවන | 40 | 37 | 03 |
| ශිල්පීය කාර්ය මණ්ඩලය | 12 | 10 | 02 |
| අර්ධ ශිල්පීය කාර්ය මණ්ඩලය | 64 | 58 | 06 |
| ශිල්පීය නොවන කාර්ය මණ්ඩලය | 11 | 10 | 01 |
| එකතුව | 198 | 162 | 36 |

1. ආයතනයේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කරලීමේ අරමුණින් යුතුව තවත් කළමනාකරණ සහකාර තනතුරු 11 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේනතුවෙන් අනුමැතිය ලද අතර ඒ අනුව පුරප්පාඩු 21 න් වර්ෂය තුළදිම තනතුරු 20 ක් සඳහා බඳවා ගැනිමද වර්ෂය තුළදිම සිදු කරන ලදි.

2. 2013 වර්ෂය තුළදී තවත් සහකාර සමුද්‍ර පරිසර නිලධාරි තනතුරු 26 සඳහා අනුමැතිය ලද අතර ඉන් තනතුරු 17 ක් සඳහා 2014 වර්ෂය තුළදී බඳවා ගැනීම් සිදු කරන ලදි.

3. අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල වල ක්ෂේත්‍ර කටයුතු සඳහා රුපියල් මිලියන 2 ක් වැය කර යතුරුපැදි 10ක් මිලදී ගන්නා ලදි.

4. අධිකාරියේ සභාපති හා සාමාන්‍යාධිකාරි සඳහා රුපියල් ලක්ෂ 98 බැගින් වු මෝටර් රථ දෙකක් මහා භාණ්ඩාගාරයේ ප්‍රදානයක් ලෙස ලැබිණ.

5. මහල් තුනකට සීමාවී තිබූ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, ආයතනික මෙහෙයුම් හා පරිපාලන අවශ්‍යතා මත මහල් 5 ක් දක්වා ව්‍යාප්ත කර මිලියන 4 කට ආසන්න මුදලක් වැයකර නවීකරණය කරන ලදි.

6. වර්ෂය තුලදී රුලියල් මිලියන 8 කට ආසන්න මුදලක් වැයකර කාර්යාල උපකරණ මිලදී ගත් අතර , මිලියන 15 කට ආසන්න මුදලක් වැයකර රසායනාගාර හා ජල තත්ත්ව පරීක්ෂණ උපකරණ මිලදී ගන්නා ලදි.

## 5.2 නීති අංශය

1. 2014 ජුලි මස 01වන දින පෞද්ගලික ආයතනයක කර්මාන්තශාලාවකින් කළුතර කැලිඩෝ වෙරළාශ්‍රිතව සිදුවූ සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට ඇති හැකියාව සහ මෙම අධිකාරිය විසින් සිදුකරන ලද පවිත්‍ර කිරීමේ මෙහෙයුම වෙනුවෙන් වැයකරන ලද මුදල අයකරගැනීම සම්බන්ධයෙන් නීතිපති සමඟ සාකච්ඡා කරන ලදී.

2. 2012 අගෝස්තු මස 23 වන දින පානදුර බාහිර වරාය ආශ්‍රිතව Thermophylae Sierra නෞකාවෙන් සිදුවූ සමුද්‍ර පරිසර දූෂණයට අදාලව පනතේ 26 වන වගන්තිය යටතේ නීතිමය පියවර ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් නීතිපති සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා වෙමින් පවතී.

3. පනතේ 51 වන වගන්තිය යටතේ කෙටුම්පත් කර ඇති නමුත් මේ දක්වා ප්‍රකාශයට පත්වී නැති ඉතිරි නියෝග 05 නීති කෙටුම්පත් සම්පාදක වෙත භාරදී ඇති අතර අවසන් කිරීම පිළිබඳව අඛණ්ඩව සාකච්ඡාවෙමින් පවතී.

4. 2012 අගෝස්තු 15 දින ප්‍රකාශයට පත් වූ 2012 අංක 01 දරන තෙල් උතුරායාම පිළිබඳ හදිසි සැලැස්ම නියෝග සහ 2013 ජුනි මස 28 දින ප්‍රකාශයට පත් වූ 2013 අංක 01 දරන සමුද්‍ර පරිසර ආරක්ෂණ (මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත්‍ර නිකුත්කිරීමේ) නියෝග, පනතෙහි 51 (4) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගන්නා ලදී.

5. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් "අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන පරිසර නීතින් හි පවතින අඩුපාඩු සමාලෝචනය කර අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පනත් සංශෝධනයන් සම්බන්ධයෙන් ආයතන මට්ටමින් අදහස් හා යෝජනා ලබාගැනීම" සඳහා ඇති කරන ලද ව්‍යාපෘතිය යටතේ අමාත්‍යාංශය යටතේ පවත්නා සියළුම ආයතනයන්හි නීති අංශ වල සහභාගීත්වයෙන් පවත්නා පනත් වල අඩුලුහුඩුකම් පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡා කිරීම පිණිස ත්‍රිපුද්ගල උපදේශක මඩුල්ලක් පත්කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ එකී සියලුම ආයතන වල නීති අංශයන්හි අවශ්‍යතා අනුව දිවයින පුරා විවිධ ප්‍රදේශයන්හි පවත්වන ලද ක්ෂේත්‍ර චාරිකාවන්ට සහභාගී වෙමින් සහ සාකච්ඡා පවත්වමින් ප්‍රායෝගික වශයෙන් එකී ගැටළුවලට විසඳුම් සෙවීමට කටයුතු කරන ලදී.

ඒ අනුව පවත්නා සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත වඩාත් අර්ථවත් ලෙස සංශෝධනය කිරීම සඳහා නීති අංශය විසින් එකී උපදේශකවරුන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ඇතුළු විද්වත් මඩුල්ලක ප්‍රධානත්වයෙන් සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කරන ලදී. ඒ අනුව සකස් කරන ලද මෙම ව්‍යාපෘතියට අදාළ අවසන් වාර්තාවේ අඩංගු යෝජිත සංශෝධන පිළිබඳව සාකච්ඡාවක් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2014.12.04 වන දින පවත්වන ලද අතර යෝජිත සංශෝධන කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු පිණිස කටයුතු කරනු ලැබේ.

6. මෙම අධිකාරිය වෙත ලැබුනු මහජන පැමිණිලි ඇතුළු තොරතුරු අනුව ක්ෂණිකව ක්‍රියා කරමින් බෙන්තොට සමන්විලා නැමති හෝටලයකින් සිදුවෙතියි කියන සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමේදී යම් යම් බාධක උද්ගත වූ හෙයින් අපද්‍රව්‍ය/ අපජලය බැහැර කිරීම සඳහා වහාම නිසි පියවර ගන්නා මෙන් එකී හෝටලයට විධානය කරන ලද අතර යෝජිත sea outfall නල පද්ධති යෙදීම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා අදාල

අනෙකුත් ආයතන සමඟ සාකච්ඡා පවත්වන ලදී.
හෝටලය මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව නීති අංශය මෙම අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ දකුණු ප්‍රාදේශීය කාර්යාල සමඟ නිරතුරුව අධීක්ෂණය කරමින් වාර්තා ලබා ගැනීමට කටයුතු කරයි.

7. 2013.11.13 වන දින කොළඹ වරාය ආශ්‍රිතව M.T.CHAHAT නැමති නෞකාවකින් සිදුවූ සමුද්‍ර පරිසර දූෂණය සම්බන්ධයෙන් පනතෙහි ප්‍රතිපාදන අනුව පවරන ලද නඩුවෙහි දෙන ලද මහාධිකරණ තීන්දුව අනුව 2014.04.01 වන දින රු:40,000/- ක වන්දි මුදලක් අදාල නෞකාවේ දේශීය ඒජන්ත සමාගම විසින් ගෙවීමට නියම කරන ලද අතර නඩුවෙහි අවස්ථානුගත කරුණු අනුව එලෙස පනතෙහි නියමිත අවම වන්දි ප්‍රමාණයට වඩා අඩු වන්දි ප්‍රමාණයක් ගෙවීමට නියෝග කරන ලද බව නීතිපති විසින් ලිඛිතව පැහැදිලි කොට ඇත.

## <u>5.3අභ්‍යන්තර විගණන අංශය</u>

අධිකාරියේ ස්ථාපිත කර ඇති අනෙක් අංශ දෙස බලන කල අභ්‍යන්තර විගණන ඒකකයට ඉතා සුවිශේෂී ස්ථානයක් හිමිවන බව පෙන්වා දිය හැකිය.

මෙහිදී අධිකාරියේ සභාපතිතුමාගේ මගපෙන්වීම හා ඍජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇත. වාර්ෂිකව පිළියෙල කරන අභ්‍යන්තර විගණන සැලැස්ම හා විගණන වැඩසටහන මත පදනම්ව කටයුතු කරන අතර එහිදී මෙම අංශය විසින් ප්‍රධාන වශයෙන් ආයතනයේ මූල්‍ය, මෙහෙයුම්, පරිපාලන හා නීති යන අංශයන්හි ඵලදායී ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නිරීක්ෂනයක් පවත්වනු ලැබේ. එම නිරීක්ෂණ හා සොයා ගැනීම් මත පදනම්ව සකස් කරන අභ්‍යන්තර විගණන වාර්තා සභාපතිතුමාගේ අවධානය හා තීරණ ගැනිම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

එහිදී පහත කර්තව්‍යයන් අදාල කරගනු ලැබේ.

1 වැරදි හා වංචා වැලැක්වීම සඳහා ස්ථාපිත කර ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේදය විමර්ශනය.

2 යම්කිසි මූල්‍ය කටයුත්තක් සත්‍ය හා සාධාරණව සිදුවන්නේ ද යන්න සොයා බැලීම සඳහා මූල්‍ය පාලන ක්‍රමවේදය විමර්ශනය.

3 ආයතනයේ සේවකයන් සඳහා ලබාදී ඇති රාජකාරි හා වගකීම් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුවන්නේ ද යන්න සුපරීක්ෂණය.

4 ආයතනයේ මෙහෙයුම් හා පාලන කටයුතු සඳහා භාවිතා කරන ස්ථාවර වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කරන්නේද යන්න පරීක්ෂාව.

5 රාජ්‍ය ප්‍රතිපත්ති, නීති රීති හා අධිකාරියේ අභ්‍යන්තර නීති වලට අනුකූල වන්නේද පරීක්ෂාව.

6 අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්වීම.

අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව ප්‍රධාන අංශ පමණක් නොව ප්‍රාදේශීය කාර්යාලයන්ද විගණනයට භාජනය කරයි. විගණන කාර්යයන් අතර මෙම අංශයේ ප්‍රධාන කාර්යයක් වනුයේ කාර්තුවකට වරක් විගණන හා කළමනාකරණ රැස්වීමක් පැවැත්වීමය. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදේශනාත්මක කමිටුවක් ලෙස මෙම කමිටුව හඳුන්වාදිය හැකිය. 2014 වර්ෂයේ මෙම කමිටු රැස්වීම් 4 ක් පැවැත්වූ අතර එම රැස්වීම් වාර්තා සභාපති, සමාන්‍යාධිකාරි හා අදාල අංශවලට අදාල කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලැබිය.

## <u>5.4 මානව සම්පත් සංවර්ධන අංශය</u>

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජික මහත්ම මහත්මීන් පුහුණු කිරීම තුලින් ඔවුන්ගේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම මානව සම්පත් සංවර්ධන අංශයේ වගකීම වන අතර අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි වන

සාමාන්‍යාධිකාරීවරයාගේ සියලු මහපෙන්වීම යටතේ මෙම අංශය කටයුතු කරනු ලබයි.

අංශයේ වගකීම්

1. අධිකාරියේ කාර්ය මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව වර්ධනය කිරීම සඳහා වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සම්පත් දායකයින් හඳුනා ගනිමින් දේශීය/ විදේශීය පුහුණු සැලසුම් සකස් කිරීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් එකී පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.

2. පුහුණු වීම ලබන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් නිසි පරිදි පුහුණුවීම් ලබා ගන්නේද එසේ නොමැති නම් එහි අඩුපාඩු තිබේද යන්න පසුවිපරම් කිරීම සහ අඩුපාඩු මඟහරවා ගැනීමට අදාල ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.


3. කාර්ය මණ්ඩලයේ වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම

4. සේවක ශ්‍රේණිගත කිරීම හා උසස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

5. සේවක මණ්ඩල හා ආයතනික කටයුතු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා සෙසු බාහිර පාර්ශවයන් විසින් ඉල්ලා ඇතිතොරතුරු සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතියට යටත්ව යොමු කිරීම.

6. සේවක සුබසාධන කටයුතු.

මෙම වසරේදී අධිකාරියේ නිලධාරීන් සහභාගී වූ දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.



**<u>5.5 මුල්‍ය අංශය</u>**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මුල්‍ය අංශය එහි මුල්‍ය කළමනාකරණ කටයුතු සඳහා වගකීම දරනු ලබයි. සමස්ථයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය කෙරෙහි බලපානු ලබන සියලුම ආර්ථික හා මුල්‍යමය කාරණා සම්බන්ධයෙන් මුල්‍ය සම්පත් ස්ථානගත කිරිම හා සියලුම අරමුණු සඳහා මුල්‍ය සම්පත් බෙදාහැරිම සිදුකරනු ලබයි. කාර්යක්ෂමවත් ඵලදායි ලෙසත් අධිකාරියේ මුල්‍ය සේවා සැපයිමත් ඒ සඳහා මගපෙන්විම සිදුකිරිමත් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරිම හා පසුවිපරම් කිරිම මගින් අධිකාරියේ මුල්‍ය සම්පත් පාලනය කිරිම මුල්‍ය අංශයේ මුලික අරමුණ වේ.

ක්‍රියාකාරකම්

1. වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීම
2. මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම
3. මුල්‍ය ප්‍රකාශන වාර්තා හා මාසික අයවැය පිළිබඳ වාර්තා සැපයීම
4. වැටුප් හා වේතන සඳහා වු වාර්තා තැබිම හා ගෙවිම් කිරිම
5. ව්‍යාපෘති සක්‍රියව පවත්වාගෙන යාම
6. සියලුම ගෙවිම් කටයුතු
7. ණය හා අත්තිකාරම් සම්බන්ධව ගිණුම් තැබිමේ කටයුතු
8. බැංකු සමග සම්බන්ධිකරණය
9. විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධිකරණය
10. ආයෝජන කළමනාකරණය හා අනෙකුත් කටයුතු

වසර තුළදි සිදුකරන ලද විශේෂිත ක්‍රියාකාරකම්

01 වසර තුළදී අධිකාරිය විසින් ජංගම ගිණුමේ ඉතිරිව පවතින ශේෂයන් එක්දින ඉල්ලුම් තැන්පතුවල ආයෝජනය කිරීම මඟින් රුපියල් 1,521,305.30 ක පොලී ආදායමක් උපයා ගැනීමට හැකිවිය.

## 5.5.6 මූල්‍ය ප්‍රගති වාර්තාව -2014 වර්ෂය සඳහා- පුනරාවර්තන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2014 | 2014.12.31 දිනට සත්‍ය වියදම | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | |
| | **පුද්ගල පඩිනඩි** | | | |
| 1001 | වැටුප් හා වේතන | 52,250,000.00 | 51,879,170.09 | 370,829.91 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,991,000.00 | 803,045.17 | 1,187,954.83 |
| 1003 | වෙනත් දීමනා | 1,456,000.00 | 1,173,350.00 | 282,650.00 |
| | **මුළු එකතුව** | **55,697,000.00** | **53,855,565.26** | **1,841,434.74** |
| | **ගමන් වියදම්** | | | |
| 1101 | දේශිය | 3,051,000.00 | 2,359,713.00 | 691,287.00 |
| 1102 | විදේශිය | 1,685,000.00 | 879,942.97 | 805,057.03 |
| | **මුළු එකතුව** | **4,736,000.00** | **3,239,655.97** | **1,496,344.03** |
| | **සැපයීම්** | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,600,000.00 | 1,345,557.43 | 254,442.57 |
| 1202 | ඉන්ධන | 2,515,000.00 | 1,787,473.10 | 727,526.90 |
| 1205 | වෙනත් | 250,000.00 | 64,000.00 | 186,000.00 |
| | **මුළු එකතුව** | **4,365,000.00** | **3,197,030.53** | **1,167,969.47** |
| | **නඩත්තු වියදම්** | | | |
| 1301 | වාහන | 2,923,000.00 | 2,669,628.33 | 253,371.67 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,175,000.00 | 603,072.69 | 571,927.31 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 70,045.00 | 429,955.00 |
| | **මුළු එකතුව** | **4,598,000.00** | **3,342,746.02** | **1,255,253.98** |
| | **සේවා** | | | |
| 1401 | ප්‍රවාහන | - | - | - |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 2,000,000.00 | 1,106,650.43 | 893,349.57 |
| 1403 | විදුලිය සහ ජලය | 3,000,000.00 | 2,168,131.88 | 831,868.12 |
| 1404 | බදු කුලි සහ පළාත් ආයතන බදු | 10,710,000.00 | 10,544,620.82 | 165,379.18 |
| 1405 | වෙනත් පුනරාවර්තන වියදම් | 6,600,000.00 | 2,841,405.54 | 3,758,594.46 |
| | **මුළු එකතුව** | **20,310,000.00** | **16,660,808.67** | **5,649,191.33** |
| | **පුනරාවර්තන වියදම් එකතුව** | **91,706,000.00** | **80,295,806.45** | **11,410,193.55** |

## 5.5.7 මූල්‍ය ප්‍රගති වාර්තාව -2014 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම්

| වැය විෂය | වැය විෂය විස්තරය | ඇස්තමේන්තුව 2014 | 2014.12.31 දිනට සත්‍ය වියදම | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 237,400.00 | 262,600.00 |
| 2002 | පිරියත යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000.00 | 86,119.65 | 213,880.35 |
| 2003 | වාහන | 1,500,000.00 | 1,396,263.08 | 103,736.92 |
| | **එකතුව** | **2,300,000.00** | **1,719,782.73** | **580,217.27** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2101 | වාහන | 18,780,000.00 | 18,780,000.00 | - |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 5,310,000.00 | 1,314,515.23 | 3,995,484.77 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රොපකරණ | 2,000,000.00 | - | 2,000,000.00 |
| | **එකතුව** | **26,090,000.00** | **20,094,515.23** | **5,995,484.77** |
| 2502 | අනෙකුත් ප්‍රාග්ධනය | | | |
| | 1 NOSCOP–ධාරිතා වර්ධන | 7,010,000.00 | 2,182,887.10 | 4,827,112.90 |
| | 2 අන්තර්ජාතික නීති රෙගුලාසි හා සම්මුතීන් | 220,000.00 | 246,475.00 | (26,475.00) |
| | 3 දූෂක ප්‍රභව හඳුනාගැනීම හා නිරීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම. | 1,850,00.00 | 2,089,704.50 | (239,704.50) |
| | 4 අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් | 3,050,000.00 | 1,979,899.85 | 1,070,100.15 |
| | 5 බංකරින් | - | - | - |
| | 6 ධීවර ප්‍රජාව දූෂණ වැලැක්වීමේ ක්‍රම ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම | 760,000.00 | 432,386.00 | 327,614.00 |
| | 7 විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම | 4,200,000.00 | 3,058,641.12 | 1,141,358.88 |
| | 8 ජාතික දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම | 3,080,000.00 | 561,872.25 | 2,518,127.75 |
| | 9 ක්ෂේත්‍ර වශයෙන් සිදුවන සමුද්‍ර දූෂණය අවම කිරීම | 6,820,000.00 | 1,313,521.80 | 5,506,478.20 |
| | 10 ජාතික සංවර්ධන වැඩසටහන් | 1,800,000.00 | 1,126,921.30 | 673,078.70 |
| | 11 දැනුවත් කිරීමේ වැඩසටහන් | 1,200,000.00 | 457,380.00 | 742,620.00 |
| | 12 සොඳුරු සයුර¨ වැඩසටහන් | 2,450,000.00 | 2,355,328.85 | 94,671.15 |
| | 13 සමුද්‍ර ආශ්‍රිත පරිසර පද්ධති ආරක්ෂා කිරීම | 3,550,000.00 | 6,240.00 | 3,543,760.00 |
| | 14 මානව සම්පත් සංවර්ධනය | 3,650,000.00 | 1,892,354.00 | 1,757,646.00 |
| | 15 කාර්යාල පහසුකම් වැඩිදියුණු කිරීම | 2,750,000.00 | 132,120.12 | 2,617,879.88 |
| | **එකතුව** | **42,390,000.00** | **17,835,731.89** | **24,554,268.11** |
| | **හැලැස්ට් ජල ව්‍යාපෘතිය** | **9,000,000.00** | **4,462,323.06** | **4,537,676.94** |
| | **Green F H** | **10,000,000.00** | **7,362,959.65** | **2,637,040.35** |
| | **Dayata Sewana** | **600,000.00** | **358,093.00** | **241,907.00** |
| | **ජ් අයි ජ් ව්‍යාපෘතිය** | **447,043.50** | **-** | **447,043.50** |
| | **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **70,780,000.00** | **39,650,029.85** | **31,129,970.15** |

# 6 අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන

## 6.1 ගිණුම්කරන ප්‍රතිපත්ති

### 6.1.1 සංස්ථාමය තොරතුරු

2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය ස්ථාපිත කර ඇත. අංක 758 බේස්ලයින් පාර. කොළඹ 09 යන ස්ථානයේ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇත.

### 6.1.2 ප්‍රමුඛ කාර්යභාරය හා මෙහෙයුම්වල ස්භාවය.

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූලික කර්තව්‍ය වනුයේ නියෝගයන් ඵලදායීව බලාත්මක කිරීම, අදාළ වන ජාත්‍යන්තර සම්මුතීන්වල ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීම, ආශ්‍රිත පාර්ශවයන් හා සම්පත් සම්බන්ධිකරණය හා ස්ථානගත කිරීම තුළින් වර්තමානයට හා අනාගතය සඳහා සමුද්‍රීය පරිසරය තිරසාරි ලෙස කළමනාකරණය කිරීම පිණිස ශ්‍රී ලංකා සමුද්‍ර තිරයන්හි සමුද්‍ර දූෂණය වැළැක්වීම, පාලනය කිරීම හා කළමනාකරණය කිරීමයි.

### 6.1.3 සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

6.1.3.1 **මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ පදනම**
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කොට ඇත.

ශ්‍රී ලංකා රාජය අංශය සඳහා වූ ගිණුම්කරන ප්‍රමිත 2011 සිට බලාත්මක වුවද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් එම ප්‍රමිත 2010 සිට බලාත්මක වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සඳහා භාවිතා කර ඇත.
මූලය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 01 ට අනුව ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය අංශ ප්‍රමිත නිකුත් කොට නොමැති අවස්ථාවලදී ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සඳහා භාවිතා කර ඇත.

6.1.3.2 පොදුවේ පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන 2014 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

6.1.3.3 ගිණුම් කෙරෙහි බලපාන උද්ධමන සාධකය සඳහා ගැලපීම් සිදු කර නොමැත.

6.1.3.4 ආදායම් සහ වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

6.1.3.5 අතීත ක්‍රියාකාරකමක් හේතුවෙන් වර්තමානයේ පැන නැගී ඇති වගකීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් කිරීම සිදුකරනු ලබන්නේ වගකීම පියවීම සඳහා ආර්ථිකමය ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායාමක් ඇතිවේ යැයි අපේක්ෂා කරන අවස්ථාවලදී පමණි.

6.1.3.6 මූල්‍ය ප්‍රකාශව දිනයේ සිට ඉල්ලුවිට ගෙවිය යුතු ණයහිමියන් හා වසරක් තුළදී පියවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත.

6.1.3.7 ඉල්ලුවිට ගෙවිය යුතු නොවන ණයහිමියන් හා වසරකට වඩා වැඩි කාලයක්

තුළ පියවිය යුතු වගකීම් මුලා තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස දක්වා ඇත.

### 6.1.4 දේපල, පිරියත සහ උපකරණ

6.1.4.1 දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය මත වාර්තා කරනු ලබයි. ප්‍රයෝජනවත් ජීව කාලය මත ඒවා භාවිතා කරන අරමුණ සඳහා යොදා ගන්නා අවස්ථාවේ සිට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරිම සිදුකරනු ලබයි. ක්ෂය කිරිම සඳහා භාවිතා කරන ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| වත්කම් | ක්ෂය ප්‍රතිශතය |
|---|---|
| මෝටර් රථ | 20% |
| පරිගණක ආශ්‍රිත උපකරණ | 15% |
| කාර්යාලීය උපකරණ | 15% |
| ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ | 10% |
| විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ | 10% |
| පොත්පත් | 10% |

6.1.4.2 දේපල, පිරියත සහ උපකරණ මිලදිගත් කාර්යය සඳහා එය භාවිතා කිරිමට හැකි අවස්ථාවේදී එම වත්කම ක්ෂය කිරිම ආරම්භ කරන අතර, ක්ෂය කිරිම සරල මාර්ග ක්‍රමය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය තුල සිදුකරනු ලබයි.

### 6.1.5 ආදායම

ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන් ප්‍රදාන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. මෙයට අමතරව අධිකාරිය විසින් පහත ක්‍රියාකාරකම් සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරිම මගින් සැලකිය යුතු මෙහෙයුම් අදායමක් උපයා ගනු ලබයි.

නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන පහසුකම් සැපයීම සඳහා

1 ඛණිජ තෙල් ගවේශන කටයුතු කිරිම සඳහා බලපත්‍ර නිකුත් කිරිම.
2 බංකරින් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරිම.
3 තෙල් විසිරීම් පාලන ක්‍රියාකාරි සැලසුම් අනුමත කිරිම.
4 අපද්‍රව්‍ය බැහැරකිරීම් සඳහා බලපත්‍ර නිකුත් කිරිම.

### 6.1.5.1 අධිකාරිය මගින් ජනනය කරන ආදායම

අධිකාරිය මගින් ජනනය කරනු ලබන අදායම උපචිත පදනම මත හදුනාගනු ලබයි.

6.1.5.2 රජයෙන් ලැබෙන ප්‍රදාන
අධිකාරියට ප්‍රාග්ධන සහ පුනරාවර්තන ලෙස වර්ග දෙකක ප්‍රදාන ලැබේ. ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය පහත දැක්වේ.

### 6.1.5.3 ප්‍රාග්ධන ප්‍රදාන

6.1.5.4 දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනිම හා ඉදිකිරිම සඳහා ලැබෙන ප්‍රදාන අදාල වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය තුළ ආදායම හැටියට හදුනාගැනීම සිදු කරනු ලබයි.

6.1.5.5 ශ්‍රී ලංකාව වටා සිදුවිය හැකි සමුද්‍ර දූෂණය වැලැක්විම ආශ්‍රිත කටයුතු සඳහා ලැබෙන ප්‍රදාන අස්පෘශ්‍ය වත්කම් නිර්මාණය සිදු වුවද අස්පෘශ්‍ය වත්කම් හදුනාගැනිමේ නිර්ණායකයන් සම්පූර්ණ විමක් සිදුනොවන බැවින් සමුද්‍ර දූෂණ වැලැක්විමේ ක්‍රියාකාරකම් සඳහා දරනු ලබන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන අදාල ක්‍රියාකාරකම් සිදුකරනු ලැබූ වර්ෂයේ අදායමක් ලෙස හදුනාගැනිම සිදුකරනු ලබයි.

### 6.1.5.6 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන අදාල වර්ෂය තුළ ම අදායමක් හැටියට හදුනාගනු ලැබේ.

### 6.1.6 සේවක ප්‍රතිලාභ

### 6.1.6.1 නියත දායකත්ව සැලසුම්

දායකත්ව ප්‍රතිලාභ සඳහා වන වගකීමට අදාල වන වියදම් දරණ කාලපරිච්ඡේදය තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. සේවකයනගේ දළ වැටුප පදනම් කරගෙන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සහ සේවක අර්ථසාධක අරමුදලට පිළිවෙලින් 3% සහ 15% ක දායකත්වය අධිකාරිය විසින් දරනු ලබයි.

### 6.1.6.2 නියත ප්‍රතිලාභ සැලසුම

පාරිතෝෂිතය නියත ප්‍රතිලාභ සැලසුම වේ. අදාළ වන ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මත සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය පාරිතෝෂිත ගෙවීමට බැඳි සිටී. මෙම වගකීම සඳහා වෙන් කිරීමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇත. මෙම මුදල ගණනය කරනු ලබන්නේ සේවකයාගේ වර්ෂ අවසාන වැටුපෙන් භාගයක් ඔහු සම්පූර්ණ කරන ලද සේවා කාලයෙන් වැඩි කිරීමෙනි. සේවා කාලය ගණනය කරනු ලබන්නේ සේවයේ පළමු වසරේ සිටයි. 1983 අංක 12 දරණ පාරිතෝසිත ගෙවීම් පනත යටතේ සියලුම සේවකයන් සඳහා පාරිතෝෂිතය සඳහා වෙන් කිරීමක් සිදුකර ඇත. මෙම වෙන්කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

### 6.1.7 සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදි සන්සන්දනාත්මක තොරතුරු නැවත සකස් කර ඇත.

### 6.1.8 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

සියලු ප්‍රමාණාත්මක ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් සලකා බලන ලද අතර ගැලපුම් කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවලදි හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන අවස්ථාවලදි අදාල තොරතුරු සටහන් වශයෙන් මූලය ප්‍රකාශනවල ඇතුළත් කොට ඇත.

### 6.1.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කොට සකස් කර ඇත.

### 6.1.10 වාර්තා කරන හා ඉදිරිපත් කරන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇත. එය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්තා කරන මුදල් ඒකකයද ශ්‍රී ලංකා රුපියල් වේ.

### 6.1.10.1 තොගය

වසර තුළ භාවිතා කරන ලද තොගයෙහි පිරිවැය පදනම් කරගෙන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම සිදුකරනු ලබයි. වසර අවසානයේ ඉතිරි තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් වඩා අඩු අගයට අගය කරනු ලබයි.

### 6.1.10.2 පුස්තකාල පොත්

පුස්තකාල පොත් ඒවායේ පිරිවැය මත වාර්තා කර ඇත. ප්‍රයෝජනවත් ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය පදනම් කර ගනිමින් මෙම පොත් ක්ෂය කිරීම සිදුකරනු ලබයි.

### 6.1.10.3 රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ තොග

රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණවල මිලදී ගැණුම් පිරිවැය අදාල මිලදී ගැනීම සිදුවූ කාල පරිච්ඡේදය තුළදීම මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ සම්බන්ධයෙන් වන අධිකාරියේ ප්‍රතිපත්තිය වේ. මෙම ක්‍රමවේදය භාවිතා කිරීම සිදුකරනු ලබන්නේ රසායන ද්‍රව්‍යවල වර්ෂය අවසානයේ පවතින තොගය නිශ්චිතව ගණනය කිරීමට ඇති ප්‍රායෝගික දුෂ්කරතාවය සහ සමහර වීදුරු උපකරණ ඉතා කෙටි කාලපරිච්ඡේදයක් තුළදී භාවිතයෙන් ඉවත් කොට නැවත ලබගැනීමට සිදු වීමයි. කෙසේ වුවද විද්‍යාගාරය විසින් රසායන ද්‍රව්‍ය සහ වීදුරු උපකරණ සඳහා තොග ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි.

.

# 6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

2014 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| වත්කම් | සටහන | 2014<br>රු | 2013<br>රු |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් ශේෂය | 10 | 31,857,634.23 | 15,553,928.21 |
| ණයගැතියෝ | 11 | 47,257.00 | 22,250.00 |
| තැන්පතු | 12 | 2,029,500.00 | 2,014,100.00 |
| ඉදිරියට කල ගෙවීම් | 13 | 2,071,779.68 | 602,149.49 |
| කෙටිකාලින ආයෝජන(භාණ්ඩාගාර බිල්පත්) | | 13,916,147.26 | 12,979,451.23 |
| අයකර ගත යුතු සේවක ණය | 14 | 5,159,503.18 | 6,238,964.09 |
| තොගය | 23 | 3,858,594.00 | 3,858,594.00 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපලපිරියත සහ උපකරණ , | 09 | 64,955,616.96 | 38,211,544.09 |
| **මුළු වත්කම්** | | **123,896,032.31** | **79,480,981.11** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත ගෙවීම් | 15 | 15,543,605.37 | 422,894.10 |
| පාරිසරික තත්ත්ව ඇගයිම් ව්‍යාපෘතිවල තැන්පතු | 21 | 447,043.50 | 447,043.50 |
| කලින් ලද ආදායම් ලැබීම් | 22 | 1,453,219.18 | 2,015,000.00 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සමුද්‍ර පරිසර ආරක්ෂණ අරමුදල | 20 | 15,516,150.13 | 14,579,453.20 |
| ආපදා ණය සඳහා මුදල | 16 | 6,984,853.28 | 6,752,928.71 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 17 | 9,135,060.00 | 7,284,380.00 |
| **මුළු වගකීම්** | | **49,079,931.46** | **31,501,699.51** |
| **ශුද්ධ වත්කම්** | | **74,816,100.86** | **47,979,281.60** |
| **හිමිකම්** | | | |
| රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධනය (විලම්බිත ප්‍රදාන) | 18 | 64,955,616.49 | 38,211,543.55 |
| වැඩ නිමවි නොමැති ප්‍රාග්ධන වියදම් | 24 | 19,530,151.57 | 14,481,822.55 |
| තොග සඳහා ප්‍රාග්ධන යෙදවුම් | 23 | 3,858,594.00 | 3,858,594.00 |
| උපචිත හිගයඅතිරික්තය/ | 19 | (13,492,831.26) | (8,572,678.50) |
| **මුළු හිමිකම්** | | **74,816,100.86** | **47,979,281.60** |

# 6.3 මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය

| ආදායම | සටහන | 2014<br>රු | 2013<br>රු |
|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 1 | 100,052,473.75 | 79,059,481.67 |
| ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තුව | 2 | 12,038,930.82 | 11,976,053.17 |
| වෙනත් ආදායම් | 3 | 2,619,793.00 | 1,168,403.50 |
| **මුළු ආදායම** | | **114,711,197.57** | **92,203,938.34** |
| **වියදම්** | | | |
| වැටුප් හා වේතන ගෙවීම් | 4 | 55,794,565.26 | 41,797,413.42 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 5 | 6,539,776.55 | 5,297,828.16 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6 | 19,865,034.64 | 14,482,504.22 |
| ප්‍රදාන හා මාරු කිරිම් | 7 | 24,906,853.19 | 23,058,734.95 |
| මූල්‍ය වියදම් | 8 | 35,430.00 | 36,800.00 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම් | 9 | 12,525,120.63 | 10,335,446.79 |
| **මුළු වියදම්** | | **119,666,780.27** | **95,008,727.55** |
| කාලපරිච්ඡේදය සඳහා<br>ඌණතාවයඅතිරික්තය/ | | **(4,955,582.70)** | **(2,804,789.20)** |

# 6.4 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධන ප්‍රදාන | තොගයට අදාල ප්‍රදාන | | සමුච්චිත හිගයඅතිරික්තය/ | එකතුව |
|---|---|---|---|---|---|
| දිනට ශේෂය 2014.01.01 | 38,211,546.13 | 3,858,594.00 | 14,481,822.55 | (8,572,678.56) | 47,979,284.12 |
| ගිණුම්කරන ප්‍රතිපත්ති වෙනස්විම | | | | | |
| දිනට ගලපන ලද 2013.01.01 ශේෂය | 38,211,546.13 | 3,858,594.00 | 14,481,822.55 | (8,572,678.56) | 47,979,284.12 |
| ප්‍රාග්ධන අරමුදල් ලැබිම | 81,567,016.84 | - | | - | 81,567,016.84 |
| ප්‍රාග්ධන ප්‍රදාන ආදායමට මාරු කිරිම . | (37,431,973.75) | - | (12,342,641.13) | - | (49,774,614.88) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තයඌණතාවය/ | | | | (4,955,582.70) | (4,955,582.70) |
| 2014.12.31 දිනට ශේෂය | **82,346,589.22** | **3,858,594.00** | **2,139,181.42** | **(13,528,261.26)** | **74,816,100.85** |

# 6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

2014 වසර සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014 | 2013 |
|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| **කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තයඌණතාවය/** | (4,955,582.70) | (2,804,789.20) |
| **ගැලපුම් කිරිම** | | |
| වර්ෂය සඳහා ක්ෂය වෙන්කිරිම | 12,525,120.63 | 10,335,446.79 |
| ආරම්භක ශේෂයට ගැලපුම් | | |
| අත්තිකාරම් වියදමට මාරු කිරිම | | |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම | 1,939,000.00 | 1,331,818.00 |
| පාරිතෝෂිත ගෙවීම් | (88,320.00) | (72,712.50) |
| හදුනාගත් ආදායම් ඉකුත් වර්ෂවල ප්‍රදානයන්ගෙන් | (37,431,973.75) | (33,394,181.67) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තයඌණතාවය/** | (28,011,755.82) | (24,604,418.58) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තැන්පතු (වැඩිවීම/අඩුවීම) | (15,400.00) | (795,000.00) |
| පෙර ගෙවුම්(වැඩිවීම/අඩුවීම) | (1,469,630.19) | (4,754.68) |
| ණයගැතියන්ගෙන්(වැඩිවීම/අඩුවීම) | (25,007.00) | (8,750.00) |
| ජංගම බැරකම්වලින්(වැඩිවීම/අඩුවීම) | 15,120,711.27 | (1,949,545.16) |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(14,401,081.74)** | **(27,362,468.42)** |
| **ආයෝජන කටයුතු** | | ෙ |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | (13,916,147.26) | (12,979,451.23) |
| භාණ්ඩාගාර බිල්පත් කල්පිරිම | 12,979,451.23 | 11,755,525.00 |
| දේපලපිරියත හා උපකරණ මිලදී ගැනිම , | (20,489,193.50) | (4,952,734.00) |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජන පොළි | 936,696.93 | 1,223,927.46 |
| කාර්යමණ්ඩල ණයෙන් ලද ණය පොළිය | 231,924.57 | 188,145.59 |
| කාලපරිච්ඡේදයේ කාර්යමණ්ඩල ණය (වැඩිවිම/අඩුවිම) | 1,079,460.91 | (605,293.86) |
| කලින් ලද ආදායම | (561,780.82) | 321,000.00 |
| **ආයෝජන කටයුතු වලින් ශුද්ධ ජනනය වූ මුදල් ප්‍රවාහය** | **(19,739,587.94)** | **(5,048,881.04)** |
| **මූල්‍යනය කටයුතු** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 50,444,375.71 | 42,453,344.50 |
| බැංකු ගාස්තු මහජන බැංකුව | | (857.10) |
| **මූල්‍යය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **50,444,375.71** | **42,452,487.40** |
| කාලපරිච්ඡේදය තුළ මුදල් හා මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවිමවැඩිවීම/ | **16,303,706.03** | **10,041,137.94** |
| වසර ආරම්භයේදි මුදල් හා මුදල් වලට සමාන දෑ | **15,553,928.21** | **5,512,790.27** |
| වසර අවසානයේදි මුදල් හා මුදල් වලට සමාන දෑ | **31,857,634.24** | **15,553,928.21** |

# 6.6 මුල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## මුල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සටහන 01 | භාණ්ඩාගාරයේ ප්‍රදාන | |
|---|---|---|
| | **2014** | **2013** |
| පුනරාවර්තන ප්‍රදාන | 62,620,500.00 | 45,665,300.00 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව වර්තන වර්ෂයප්‍ර - | 24,906,853.19 | 23,058,734.95 |
| ආදායමට ප්‍රාග්ධන ප්‍රදාන මාරුව දානවිලම්බිත ප්‍ර - | 12,525,120.56 | 10,335,446.72 |
| | **100,052,473.75** | **79,059,481.67** |

| සටහන 02 | ගාස්තු දඩ මුදල් හා බලපත්‍ර ගාස්තු | |
|---|---|---|
| | **2014** | **2013** |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවයලියාපදිංචි ගාස්තු - | 4,037,900.00 | 3,859,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය ගාස්තුබලපත්‍ර - | 5,832,250.00 | 5,249,000.00 |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය-ඉල්ලුම්පත්‍ර ගාස්තු | 45,000.00 | 52,000.00 |
| ස්භාවික සම්පත් නිස්සාරණය ගාස්තුබලපත්‍ර - | - | 1,243,617.00 |
| ස්භාවික සම්පත් නිස්සාරණය ගාස්තුඉල්ලුම්පත්‍ර- | - | 12,436.17 |
| බංකරින් ඉල්ලුම්පත්‍ර ගාස්තු | 14,000.00 | 15,000.00 |
| බංකරින් ලියාපදිංචිය 2014 | 1,715,000.00 | 1,240,000.00 |
| Road Tunker ලියාපදිංචිය | - | 204,000.00 |
| NOSCOP ඉල්ලුම්පත්‍ර ගාස්තු | | 101,000.00 |
| Dumping ආදායම | 394,780.82 | 11,976,053.17 |
| | **12,038,930.82** | **11,976,053.17** |

| සටහන 03 | වෙනත් ආදායම් | |
|---|---|---|
| | **2014** | **2013** |
| සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු | 276,000.00 | - |
| වෙනත් ආදායම් | 819,645.00 | 106,000.10 |
| පොත් අත්තිකාරම් පොළිය | 2,842.70 | - |
| පොළි ආදායම් | 1,521,305.30 | 962,403.40 |
| චෙක්පත් අවලංගු කිරිම | - | 100,000.00 |
| | **2,619,793.00** | **1,168,403.50** |

| සටහන 04 | වැටුප් හා සේවක ප්‍රතිලාභ ගෙවීම | |
|---|---|---|
| | **2014** | **2013** |
| වැටුප් හා වේතන | 51,879,170.09 | 38,527,131.02 |
| අතිකාලනිවාඩු දින ගෙවීම්/ | 803,045.17 | 651,364.40 |
| වෙනත් දීමනා | 1,173,350.00 | 1,287,100.00 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරිම් | 1,939,000.00 | 1,331,818.00 |
| | **55,794,565.26** | **41,797,413.42** |

| සටහන 05 | සැපයුම් හා භාවිතාකල පාරිභෝජන භාණ්ඩ | |
|---|---|---|
| සැපයුම් 05.01 | **2014** | **2013** |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,345,557.43 | 831,669.30 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,787,473.10 | 1,390,709.00 |
| නිල ඇඳුම් | 64,000.00 | 67,335.50 |
| | **3,197,030.53** | **2,289,713.80** |

| | | |
|---|---|---|
| නඩත්තු වියදම් 05.02 | | |
| වාහන නඩත්තු වියදම් | 2,669,628.33 | 2,263,944.35 |
| පිරියත සහ උපකරණ නඩත්තු වියදම්යන්ත්‍ර , | 603,072.69 | 642,788.02 |
| කාර්යාල නඩත්තු වියදම් | 70,045.00 | 101,382.00 |
| | **3,342,746.02** | **3,008,114.36** |

| සටහන **06** | වෙනත් පුනරාවර්තන වියදම් | |
|---|---|---|
| ගමන් වියදම් 06.01 | **2014** | **2013** |
| දේශිය ගමන් වියදම් | 2,359,713.00 | 1,545,254.17 |
| විදේශිය ගමන් වියදම් | 879,942.97 | 491,836.55 |
| | **3,239,655.97** | **2,037,090.72** |
| ගිවිසුම් ගත සේවා 06.02 | | |
| විදුලි සංදේශ තැපැල් ගාස්තු/ | 1,106,650.43 | 956,572.74 |
| විදුලි බලය සහ ජල වියදම් | 2,168,131.88 | 2,032,155.77 |
| කාර්යාල කුලී | 10,544,620.82 | 7,343,081.94 |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 2,805,975.54 | 2,113,603.05 |
| | **16,625,378.67** | **12,445,413.50** |

| සටහන **07** | ප්‍රදාන සහ අනෙකුත් මාරු කිරීම් | |
|---|---|---|
| | **2014** | **2013** |
| වසර සඳහා වු මුළු ප්‍රාග්ධන ප්‍රදාන | 81,567,016.84 | 42,493,291.50 |
| අඩුකලා: | | |
| ප්‍රාග්ධන වත්කම් මිලට ගැනිම සඳහා යොදා ගත් ප්‍රදාන | (39,269,193.50) | (4,952,734.00) |
| වැඩ නිම වි නොමැති ප්‍රාග්ධන වියදම් | (17,390,970.15) | (14,481,822.55) |
| වසර තුළ මූලා‍ය මෙහෙයුම් ප්‍රකාශයට මාරු කිරීම් | **24,906,853.19** | **23,058,734.95** |

| සටහන 08 | මුල්‍ය වියදම් | |
|---|---|---|
| | **2014** | **2013** |
| බැංකු ගාස්තු | 35,430.00 | 36,800.00 |
| | **35,430.00** | **36,800.00** |

| සටහන 09 | දේපලපිරියත හා උපකරණ ක්ෂයවීම්, | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වත්කම් වර්ගය | පිරිවැය-2014 | | | ක්ෂය – 2014 | | | ලියාහල අගය |
| | 01.01.2014 | එකතු වීම | 31.12.2014 | 01.01.2014 | එකතු වීම | 31.12.2014 | |
| මෝටර් රථ | 36,048,912.63 | - | 36,048,912.63 | 17,261,417.40 | 6,069,676.00 | 23,331,093.40 | 12,717,819.23 |
| දැව භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 21,372,205.07 | 2,167,186.60 | 23,539,391.67 | 10,777,448.79 | 2,240,580.77 | 13,018,029.56 | 10,521,362.11 |
| තාක්ෂණික උපකරණ | 18,534,925.49 | 2,572,599.40 | 21,107,524.89 | 4,512,427.74 | 1,992,244.72 | 6,504,672.46 | 14,602,852.43 |
| පුස්තකාල පොත් | 189,508.50 | 212,948.00 | 402,456.50 | - | 32,945.31 | 32,945.31 | 369,511.19 |
| එකතුව | **75,956,043.19** | **12,903,678.52** | **113,649,579.62** | **32,551,293.93** | **10,335,446.79** | **23,238,054.60** | **38,211,544.09** |

| සටහන 10 | මුදල් හා මුදල් වලට සමාන දෑ | |
|---|---|---|
| මුදල් හා මුදල් වලට සමාන දෑ | **2014** | **2013** |
| ලංකා බැංකුව194109- | 30,007,284.13 | 15,039,963.59 |
| මහජන බැංකුව | 1,825,350.10 | 513,964.62 |
| ලංකා බැංකුව -75553755 | 25,000.00 | - |
| | **31,857,634.23** | **15,553,928.21** |

| සටහන 11 | ණයගැතියෝ | |
|---|---|---|
| | **2014** | **2013** |
| පියවා නොමැති අත්තිකාරම් | 32,507.00 | - |

| | | |
|---|---|---|
| ශෙහාන් කුරුනේරු -කුලී ගෙවීම් | 6,000.00 | 13,500.00 |
| පුනරාවර්තන අත්තිකාරම් | 8,750.00 | 8,750.00 |
| | **47,257.00** | **22,250.00** |

| සටහන 12 | තැන්පතු | |
|---|---|---|
| | **2014** | **2013** |
| තැන්පතු කුලී- ප්‍රාදේශිය කාර්යාලය ගාල්ල | 96,000.00 | 96,000.00 |
| තැන්පතු කුලී -ප්‍රධාන කාර්යාලය | 1,890,000.00 | 1,890,000.00 |
| තැන්පතු කුලී - ප්‍රාදේශිය කාර්යාලය ත්‍රිකුණාමලය | 7,500.00 | 7,500.00 |
| තැන්පතු ම දුරකථන සඳහා අන්තර්ජාල ජංග - පහසුකම් | 1,500.00 | 1,500.00 |
| තැන්පතු ජංගම දුරකථන සඳහා අන්තර්ජාල - පහසුකම් | 3,000.00 | 3,000.00 |
| නැවත අයවිය යුතු තැන්පතු | 31,500.00 | 6,100.00 |
| තැන්පතු - බැංකු අධ්‍යානය කේන්ද්‍රය | - | 10,000.00 |
| | **2,029,500.00** | **2,014,100.00** |

| සටහන 13 | ඉදිරියට කල ගෙවීම් | |
|---|---|---|
| | **2014** | **2013** |
| ගෙවල් කුලී පෙර ගෙවුම් | 719,589.04 | 117,369.86 |
| රථවාහන නඩත්තු වියදම් පෙර ගෙවුම් | 509,263.40 | 278,582.03 |
| නඩත්තු කටයුතු සඳහා පෙර ගෙවුම් | 256,607.91 | 156,798.68 |
| වෙනත් | 586,319.34 | 49,398.92 |
| | **2,071,779.68** | **602,149.49** |

| සටහන 14 | ආපසු අය කල යුතු කාර්යමණ්ඩල ණය | |
|---|---|---|
| | **2014** | **2013** |
| ණය ශේෂය දිනට ආරම්භක 2014.01.01 | 6,238,964.09 | 5,633,670.23 |
| එකතු කලා: | | |
| වසර තුළ දුන් ණය | 2,115,000.00 | 3,516,000.00 |
| ආපසු අයකල හැකි මුළු ප්‍රමාණය | 8,353,964.09 | 9,149,670.23 |
| අඩුකලා: | | |
| වසර තුළ අයකරගත් ණය | 3,194,460.91 | 2,910,706.14 |
| දිනට ශේෂය 2014.12.31 | **5,159,503.18** | **6,238,964.09** |

| සටහන 15 | ජංගම බැරකම් | |
|---|---|---|
| | **2014** | **2013** |
| ගෙවිය යුතු අතිකාල දීමනා | 49,775.63 | 2309.69 |
| ගෙවිය යුතු වෙනත් දීමනා | 35,250.00 | 7,500.00 |

| | | |
|---|---|---|
| ගෙවිය යුතු ගමන් වියදම් දීමනා | 252,284.72 | 157,154.75 |
| WRS ලැබීම් | 3,750.00 | 3,000.00 |
| ගෙවිය යුතු විදුලිය සහ ජල ගාස්තු | 159,633.52 | 139,826.40 |
| බැංකු තැන්පතු | 25,000.00 | - |
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 70,539.18 | 61,643.26 |
| ගෙවිය යුතු වෙනත් වියදම් | - | 51,435.00 |
| ගෙවිය යුතු මුද්දර බදු | 75.00 | 25.00 |
| සිලෝන් ෆිෂරිස් හාබර් කොපරේෂන් | 7,000,000.00 | - |
| හෙම්සන්ස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් | 574,560.00 | - |
| ඉන්ඩස්ට්‍රි සර්වේ ඉන්ජිනියර්ස් | 794,633.16 | - |
| බේරුවල හෝලිඩේ රිසෝට් | 21,500.00 | - |
| නෙලු ඇඩ්වටයිසින් ප්‍රයිවට් ලිමිටඩ් | 17,136.00 | - |
| විවෘත විශ්වවිද්‍යා - සී.ඩබ්.සෙනවිරත්න | 62,595.00 | - |
| රජයේ මුද්‍රණාලය | 100,800.00 | - |
| ඇනලිටිකල් ඉන්සිටුමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 3,712,808.01 | - |
| හල්කෙම් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 1,819,209.17 | - |
| සතොස මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 340,295.48 | - |
| හසරංග මෝටර්ස් | 138,000.00 | - |
| සංජීව මෝටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 99,275.00 | - |
| ජී.එන්. වර්ෂවිතාන | 51,460.00 | - |
| සුපර් ක්ලිනින් ඇන්ඩ් ජෙනිටෝරිය ප්‍රයිවට් ලිමිටඩ් | 37,584.96 | - |
| බ්‍රවින්ස් ඇන්ඩ් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් | 16,422.00 | - |
| නිත්මා අයි ටි සොලියුෂන් | 6,875.00 | - |
| ටොයොටෝ ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | 60,551.54 | - |
| කේ. එම්. ඇන්ඩ් ඉංජියර්ස් මෝටර්ස් | 63,142.00 | -- |
| සංජීව මෝටර්ස් ප්‍රයිවටි ලිමිටඩ් | 30,450.00 | - |
| | **15,543,605.37** | **422,894.10** |

| සටහන 16 | කාර්යමණ්ඩල ණය අරමුදල | |
|---|---|---|
| | **2014** | **2013** |
| දිනට ආරම්භක ණය ශේෂය2014.01.01 | 6,752,928.71 | 6,565,640.22 |
| එකතු කලා: | | |
| වර්ෂය සඳහා පොළිය | 231,924.57 | 188,145.59 |
| අඩුකලා: | | |
| බැංකු ගාස්තු | | (857.10) |
| දිනට ශේෂය 2014.12.31 | **6,984,853.28** | **6,752,928.71** |

| සටහන 17 | පාරිතෝෂිත සඳහා වෙන්කිරිම් | |
|---|---|---|
| | **2014** | **2013** |

| | | |
|---|---|---|
| දිනට ආරම්භක ණය ශේෂය 2014.01.01 | 7,284,380.00 | 4,480,874.50 |
| සංශෝධනය කරන ලද ශේෂය | | 1,544,400.00 |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 1,939,000.00 | 1,301,630.50 |
| | 9,223,380.00 | 7,326,905.00 |
| එකතු කලා: | | |
| වර්ෂය තුළ ගෙවීම් | 88,320.00 | 42,525.00 |
| දිනට ශේෂය 2014.12.31 | **9,135,060.00** | **7,284,380.00** |

| සටහන 18 | රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධනය | |
|---|---|---|
| | **2014** | **2013** |
| ශේෂය දිනට ආරම්භක2014.01.01 | 38,211,546.13 | 43,404,750.36 |
| වැරදි නිවැරදි කිරීම් | | 189,508.50 |
| එකතු කලා: | | |
| වසර තුළ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන | 81,567,016.84 | 42,493,291.50 |
| අඩුකලා: | | |
| ආදායම හැටියට සලකන ලදී | 37,431,973.75 | 33,394,181.67 |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් | 17,390,970.15 | 14,481,822.55 |
| දිනට ශේෂය 2014.12.31 | **64,955,619.07** | **38,211,546.13** |

| සටහන 19 | සමුච්චිත හිගය | |
|---|---|---|
| | **2014** | **2013** |
| දිනට ආරම්භක ශේෂය 2014.01.01 | (8,572,678.56) | (4,223,489.36) |
| වැරදි නිවැරදි කිරීම් විලම්බිත ආදායම් - | | - |
| වැරදි නිවැරදි කිරීම් | | - |
| විලම්බිත ආදායමට මාරු කිරීම් | | - |
| සංශෝධනය කරන ලද ශේෂය පාරිතෝෂිත - | | (1,544,400.00) |
| වර්ෂය සඳහා හිගය අතිරික්තය/ | (4,920,152.70) | (2,804,789.20) |
| දිනට ශේෂය 2014.12.31 | **(13,492,831.26)** | **(8,572,678.56)** |

| සටහන 20 | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල | |
|---|---|---|
| | **2014** | **2013** |
| දිනට ආරම්භක ශේෂය 2014.01.01 | 14,579,453.20 | 13,355,525.74 |
| පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 936,696.93 | 1,223,927.46 |
| දිනට ශේෂය 2014.12.31 | **15,516,150.13** | **14,579,453.20** |

| සටහන **21** | ඊ අයි ඒ තැන්පතු | |
|---|---|---|
| | **2014** | **2013** |
| දිනට ආරම්භක ශේෂය 2014.01.01 | 447,043.50 | 486,990.50 |
| අඩුකලා: | | |
| වර්ෂය තුළ දැරූ වියදම් | | 39,947.00 |
| දිනට ශේෂය 2014.12.31 | **447,043.50** | **447,043.50** |

| සටහන **22** | ඉදිරියට ලද ආදායම් | |
|---|---|---|
| ඉදිරියට ලද ආදායම් | **2014** | **2013** |
| අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහන සේවය ලියාපදිංචි ගාස්තු හා - **2014** ගාස්තුබලපත්‍ර | 1,081,500.00 | 1,230,500.00 |
| බංකරින් ලියාපදිංචි ගාස්තු හා බලපත්‍ර ගාස්තු **2014** | 6,000.00 | 457,000.00 |
| අපද්‍රව්‍ය බැහැර කිරීමේ නියෝග ලියාපදිංචිය **2014** | 314,719.18 | 51,500.00 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය **2014** | 51,000.00 | 276,000.00 |
| | **1,453,219.18** | **2,015,000.00** |

| සටහන **23** | ප්‍රදාන ලැබීම් | |
|---|---|---|
| ප්‍රදාන ලැබීම් | **2014** | **2013** |
| වසර තුළ ලද ප්‍රදාන | **3,858,594.00** | 3,858,594.00 |
| අඩුකලා: | | |
| අදායම් වියදම් ගිණුමට මාරු කිරීම් | - | - |
| දිනට ශේෂය 2014.12.31 | **3,858,594.00** | 3,858,594.00 |

| **සටහන 24** | **ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුම** | |
|---|---|---|
| **ප්‍රාග්ධන නොනිමි වැඩ ගිණුම** | **2014** | **2013** |
| දිනට ආරම්භක ශේෂය 2014.01.01 | 14,481,822.55 | **-** |
| එකතු කලා: | | |
| වසර තුළ මාරු කිරීම් | 17,390,970.15 | 14,481,822.55 |
| | 31,872,792.70 | 14,481,822.55 |
| අඩුකලා; | | |
| වසර තුළ දැරූ වියදම් | 12,342,641.13 | - |
| දිනට ශේෂය2014.12.31 | **19,530,151.57** | **14,481,822.55** |
| | | |

| සටහන **25** | ප්‍රාග්ධන ප්‍රදාන සැසඳුම් | |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන සැසඳුම් | **2014** | **2013** |
| වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 38,261,000.00 | 36,875,000.00 |
| වාහන සංචිතය | 18,780,000.00 | - |
| ඊ අයි ඒ වියදම් මාරුකිරිම | - | 39,947.00 |
| බැලැස්ට් ජල ව්‍යාපෘති ප්‍රදාන | 4,462,323.06 | 5,578,344.50 |
| හරිත වරාය සංවර්ධන ව්‍යාපෘතිය | 7,362,959.65 | - |
| දැයට සෙවන ව්‍යාපෘතිය | 358,093.00 | - |
| නොනිමි වැඩ ගිණුමට මාරු කිරිම් | 12,342,641.13 | - |
| මුළු ප්‍රාග්ධන ප්‍රදාන ලැබිම් | 81,567,016.84 | 42,493,291.50 |
| අඩුකිරිම: | | |
| ස්ථාවර වත්කම් මිලදි ගැනීම | (39,269,193.50) | (4,952,734.00) |
| නොනිමි වැඩ ගිණුමට මාරු කිරිම් | (17,390,970.15) | (14,481,822.55) |
| | **24,906,853.19** | **23,058,734.95** |

26 අධිකාරිය විසින් 2013 නොවැම්බර් මාසයේදි මාස 6 කදි කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් 12,979,451.23 ක් ආයෝජනය කල අතර එය 2014 වසර තුළදි කල් පිරෙන ලදී. එම මුළු මුදලම නැවත ආයෝජනය කරන ලදී. (පොළිය සහ මුල් ආයෝජන වටිනාකම) 2014 වසර තුළදි රුපියල් 936,696.03 ක් සඳහා පොළිය වශයෙන් උපයා ගන්නා ලදී. වසර තුළ නැවත ආයෝජනය කරන ලද මුදල රුපියල් 13,916,147.26 වන අතර එය මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇත.

27 අධිකාරියේ ජංගම ගිණුම්හි දිනය අවසානයේ ඉතිරිව පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදි ගැනිම සඳහා ආයෝජනය කිරිම අධිකාරිය විසින් ආරම්භ කරන ලදී. මෙම ආයෝජන ක්‍රියාවලිය වසර අවසානය දක්වා දෛනිකව ක්‍රියාත්මක කල අතර එමඟින් රුපියල් 1,521,305.30 ක පොළි ආදායමක් උපයා ගන්නා ලදී. මෙම පොළි ආදායම වර්ෂය සඳහා වන මුළු ආදායමට ඇතුළත් කර ඇත.

28 අධිකාරිය විසින් රුපියල් 39,269,193.50 ක් වටිනා ස්ථාවර වත්කම් වසර තුළදි අත්පත් කර ගන්නා ලදී. මෙම වත්කම් වලට කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ, විද්‍යාගාර උපකරණ, තාක්ෂණික උපකරණ, පරිගණක, මෝටර් සයිකල් යනාදිය ඇතුළත් විය. මෙම අගය තුළ වාහන ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාරයෙන් ලැබුනු රුපියල් 18,780,000.00 ඇතුලත්ව ඇත. (කාර් රථ 2 ක්) ඊට අතිරේකව රුපියල් 20,489,195.50 අනෙකුත් වත්කම් අත්පත් කර ගැනිම සඳහා යොදවන ලදී.

29 අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිසර ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරිමේදි දැරිමට සිදුවන වියදම් ආවරණය කර ගැනිම සඳහා 2012.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන ගාස්තුවක් අය කිරිමට තීරණය කරන ලදී. ඒ අනුව 2012 වසරේ ක්රෙන් ලංකා ආයතනයෙන් රුපියල් 500,000.00 ලැබුණි. පරිසර ශක්‍යතා අධ්‍යනයට අදාල වියදම් අඩුකිරිමෙන් පසු ශේෂය මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකිම් යටතේ ඊඅයිඒ ව්‍යාපෘති ගාස්තු ලෙස දක්වා ඇත. 2014 වසර අවසාන වන විට ශේෂය රුපියල් 447,043.50 කි.

30 පාරිතෝෂිත වෙන්කිරිම - ප්‍රතිපත්ති වෙනස්විම.

1 පාරිතෝෂිත ගණනය කිරිමේ පදනම මුලික වේතනය සහ ජිවන වියදම් දිමනාවේ එකතුව ලෙස වෙනස් කරන ලදී. (කම්කරු කොමසාරිස්වරයාගේ 2013.11.05 දින ලිපියේ උපදෙස් අනුව)

2 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත යුතු කාලය වයස අවුරුදු 60 දක්වා වැඩි කර ඇත. ඒ අනුව අධිකාරිය විසින් සේවයෙන් විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60 ක් ලෙස සලකන ලදී.

3 රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛ අනුව පාරිතෝෂිත වෙන්කිරිම සඳහා වෙනම ගිණුමක් පැවතිය යුතුය. (වෙන්කිරිම් වලට සමාන මුදල් වටිනාකමක්) 2014 වසර තුළදි ගිණුමක් ආරම්භ කිරිමට අපේක්ෂා කලද ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැති විම නිසා අධිකාරිය විසින් ගිණුමක් ආරම්භ නොකරන ලදි. ගිණුමක් ආරම්භ කර අතිරික්ත මුදල් පවතින අකාරය මත එම ගිණුමට ප්‍රතිපාදන මාරු කිරිම ඉදිරියේදි සිදුවනු ඇත.

31 ප්‍රාග්ධන කෙරිගෙන යන වැඩ

වසර තුළදි මිලියන 38.261 ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස භාණ්ඩාගාරයෙන් ලැබුණු අතර එයින් රුපියල් 20,870,029.85 ක් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා වියදම් කරන ලද අතර ශේෂය වන රුපියල් 17,390,970.15 මුදල් ශේෂයට ඇතුළත් කර ඇත. මෙම තත්ත්වය ඇතිවිමට හේතු වුයේ සැපයුම්කරුවන් සැපයුම් ප්‍රමාද කිරිමයි. ඊට අතිරේකව රුපියල් 2,139,181.42 පසුගිය වසරින් ඉදිරියට ගෙන එන ලදී. ඒ අනුව රුපියල් 17,390,970.15 මුදලක් මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිමිකම් යටතේ දක්වා ඇත.

32 තොගය

වසර තුළ තොගය සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකරන ලදී. තොගය මුල්‍ය ප්‍රකාශයේ ජංගම වත්කමක් ලෙස දක්වා ඇත.

33 පුස්තකාල පොත්

පොත්වල වටිනාකම මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පුස්තකාල පොත්වලට ඇතුළත් කල අතර පිරිවැය විලම්බිත ප්‍රධාන ගිණුමට මාරු කරන ලදි.

2012 වර්ෂයට පෙර මිලදි ගත් පොත් සහ ප්‍රධානයන් ලෙස ලැබුණු පොත්වල අගය 2014 වසර තුළ දි අගය කිරිමට ලක් නොකරන ලදී. කෙසේ වුවද පොත්පත් සඳහා විස්තර ලේඛණයක් සකස් කල අතර එය වත්කම් ලේඛණයට ඇතුළත් කර ඇත.

2012 වර්ෂයට පෙර මිලදි ගත් හා ප්‍රධාන වශයෙන් ලැබුණු පොත්පත් වල අගය ගණනය කිරිම සඳහා සාමාන්‍යාධිකාරි විසින් කමිටුවක් පත්කරන ලදී. කෙසේ වුවද මෙය ප්‍රායෝගික දුෂ්කරතා නිසා සාර්ථක නොවීය. ඒ අනුව 2012 වර්ෂයට පෙර මිලදිගත් පොත්වල අගය මුල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් නොකිරිමට තීරණය කල අතර එම පොත්පත් සඳහා ලේඛණය පවත්වාගෙන යාමට උපදෙස් දෙන ලදී.

34 දැනුවත් කිරිමේ පුවරු

2008 වර්ෂයේ සිට දිවයින ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ පුවරු සවිකර ඇත. 2008 සිට 2012 කාලපරිච්ඡේදය තුළ පසුගිය ගිණුම් අනුව දැනුවත් කිරීමේ පුවරු ඇති කිරිම සඳහා රුපියල් 7,197,220 ක් වියදම් කර ඇත.

2014.12.31 දිනට භෞතික තත්ත්වය හා අදාල විස්තර ප්‍රාදේශිය කාර්යාල විසින් වාර්තා කර ඇත. ඒ අනුව සවිස්තරාත්මක

වාර්තාවක් පිළියෙල කර එය විගණන හා කළමනාකරණ කමිටුවේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී.

සෑම දැනුවත් කිරීමේ පුවරුවක් සඳහාම අංකයක් ලබාදී ඇති අතර GPS මඟින් අදාල ස්ථාන හඳුනාගැනීම හා දැනුවත් කිරීමේ පුවරුවල ඡායාරූපයන්ද ලබාගෙන ඇත.

වාර්තාව අනුව ස්ථාපිත කරනු ලැබූ පුවරුවලින් සමහරක් ස්භාවික හේතු (සූර්යාලෝකය, සුළඟ වැනි) දැනුවත් කිරීමේ පුවරු පවත්නා ප්‍රදේශවල කරන ලද සංවර්ධන කටයුතු, මානව හා සත්ව ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත්ව ඇත. එසේම මෙම දැනුවත් කිරීමේ පුවරු අධිකාරියේ සෘජු පාලනයෙන් බැහැරව පවතින බව නිරීක්ෂණය විය. විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සහ ඉහත කරුණු සැලකීමෙන් පසුව දැනුවත් කිරීමේ පුවරුවල අගය අධිකාරියේ ස්ථාවර වත්කම්වලට ඇතුළත් නොකිරීමට උපදෙස් දුන් අතර දැනුවත් කිරීමේ පුවරුවල තත්ත්වය ප්‍රාදේශිය කාර්යාල මඟින් පරික්ෂා කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයක් හඳුන්වාදීමට තීරණය විය.

ඒ අනුව 2008-2012 වර්ෂය දක්වා ඉදිකරනු ලැබූ දැනුවත් කිරීමේ පුවරුවල අගය 2014 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීම සිදු නොකරන ලදී.

35 රසායන ද්‍රව්‍ය සහ විදුරු උපකරණ තොගය

රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ සම්බන්ධයෙන් අධිකාරිය යොදාගනු ලබන ප්‍රතිපත්ති වනුයේ රසායන ද්‍රව්‍යවල විදුරු උපකරණ මිලදී ගැනිමේ මුළු පිරිවැය මිලදීගත් වර්ෂයේ වියදමට ලියාහැරිමයි.

මෙම ක්‍රමය භාවිතා කිරිමට හේතුවනුයේ වර්ෂය අවසානයේ පවතින රසායන ද්‍රව්‍ය තොග නිවැරදි පරිදි ගණනය කිරිමේ පවතින ප්‍රායෝගික දුෂ්කරතාවය සහ විදුරු උපකරණ ඉතා කෙටිකාලයකදි භාවිතයෙන් ඉවත් කිරිමට සිදුවිමයි. කෙසේ වුවද විද්‍යාගාරය විසින් රසායන ද්‍රව්‍ය හා විදුරු උපකරණ සඳහා වෙනම තොග ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි.

36 2014.12.31 දිනට අවසන් වී නොමැති නීති කර්තව්‍යයන්

1) පානදුර වෙරළට ආසන්නව බාහිර වරාය සීමාවෙහි නැංගුරම් ලා තිබූ සයිප්‍රස් දේශයේ ධජය දරන "තර්මෝපීලෙ සියෙරා" නමැති නෞකාව මඟින් 2012 අගෝස්තු මස 23 වන දින සමුද්‍ර පරිසර දූෂණයක් සිදු වූ අතර පනතෙහි අපරාධ වගකීම (26 වන වගන්තිය) යටතේ අපරාධ නඩුවෙහි අධිචෝදනා පත්‍ර ගොනු කිරීම, මෙම පනතෙහි 50 වන වගන්තිය යටතේ නීතිපති විසින් සිදු කෙරෙනු ඇත.

මෙහෙයුමේදී දරන ලද වැය නැවත අයකර ගැනීම සඳහා සිවිල් වගකීම යටතේ ක්‍රියාකරන අතර නීතිපතිගේ තීරණය බලාපොරොත්තු වනු ලැබේ.

2) CHAHAT" නැමති නෞකාව මඟින් සිදුවන සමුද්‍ර පරිසර දූෂණයට අදාළ නඩු තීන්දුව මහාධිකරණය මගින් දෙන ලද අතර ඒ අනුව මෙම නීති කෘත්‍ය සමාප්ත වී ඇත.

3) නීතිපති විසින් ඉල්ලුම් කර ඇති සියළුම ලේඛණ/තොරතුරු ලබා දී ඇත. ඉදිරි කටයුතු සම්බන්ධයෙන් නීතිපතිගේ තීරණය බලාපොරොත්තු වනු ලැබේ.

# 6.7සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

## 2010 සිට 2014 දක්වා (රුපියල්)

| වත්කම් | | 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | | | | | | |
| මුදල් ශේෂය | 10 | 31,857,634.23 | 15,553,928.21 | 5,512,790.27 | 13,619,138.16 | 7,069,591.12 |
| ණයගැතියෝ | 11 | 47,257.00 | 22,250.00 | 13,500.00 | 16,935.00 | 98,437.49 |
| තැන්පතු | 12 | 2,029,500.00 | 2,014,100.00 | 1,219,100.00 | 1,137,800.00 | 480,800.00 |
| ඉදිරියට කල ගෙවීම් | 13 | 2,071,779.68 | 602,149.49 | 597,394.81 | 370,250.73 | 533,538.35 |
| ආයෝජන(භාණ්ඩාගාර බිල්පත්) | | 13,916,147.26 | 12,979,451.23 | 11,755,525.00 | 10,709,913.55 | 9,999,999.75 |
| අයකර ගත යුතු සේවක ණය | 14 | 5,159,503.18 | 6,238,964.09 | 5,633,670.23 | 6,257,776.56 | 3,929,914.76 |
| තොගය | 23 | 3,858,594.00 | 3,858,594.00 | | | |
| ජංගම නොවන වත්කම් | | | | | | |
| දේපලපිරියත සහ උපකරණ , | 09 | 64,955,616.96 | 38,211,544.09 | 43,404,750.36 | 39,814,309.96 | 22,359,481.89 |
| **මුළු වත්කම්** | | **123,896,032.31** | **79,480,981.11** | 68,136,730.67 | 71,926,123.96 | 44,471,763.35 |
| වගකීම් | | | | | | |
| ජංගම වගකීම් | | | | | | |
| උපචිත ගෙවීම් | 15 | 15,543,605.37 | 422,894.10 | 2,372,439.26 | 10,837,615.91 | 273,840.48 |
| තත්ත්ව ඇගයීම් ව්‍යාපෘතිවල තැන්පතු | 21 | 447,043.50 | 447,043.50 | 486,990.50 | - | - |
| කලින් ලද ආදායම් ලැබීම් | 22 | 1,453,219.18 | 2,015,000.00 | 1,694,000.00 | 12,309,913.55 | 11,600,000.00 |
| ජංගම නොවන වගකීම් | | | | | | |
| සමුද්‍ර පරිසර ආරක්ෂණ අරමුදල | 20 | 15,516,150.13 | 14,579,453.20 | 13,355,525.74 | 6,389,200.68 | 6,204,711.22 |
| ආපදා ණය සඳහා මුදල | 16 | 6,984,853.28 | 6,752,928.71 | 6,565,640.22 | 3,756,087.50 | 2,866,922.50 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම | 17 | 9,135,060.00 | 7,284,380.00 | 4,480,874.50 | 33,292,817.64 | 20,945,474.20 |
| **මුළු වගකීම්** | | **49,079,931.46** | **31,501,699.51** | **28,955,470.22** | **33,292,817.64** | **23,526,289.15** |
| **ශුද්ධ වත්කම්** | | **74,816,100.85** | **47,979,281.60** | **39,181,261.00** | **38,633,306.32** | **22,359,482.03** |
| හිමිකම් | | | | | | 1,166,807.12 |
| රජයේ ප්‍රදාන සහ ප්‍රාග්ධන(විලම්බිත ප්‍රදාන) | 18 | 64,955,616.49 | 38,211,543.55 | 43,404,750.36 | 23,526,289.15 | 19,233,732.64 |
| උපචිත හිගය | 19 | (13,492,831.26) | (8,572,678.50) | (4,223,489.36) | (1,181,004.78) | **1,166,807.12** |
| වැඩ නිමවී නොමැති ප්‍රාග්ධන වියදම් | 24 | 19,530,151.57 | 14,481,822.55 | - | - | - |
| තොග සඳහා ප්‍රාග්ධන යෙදවුම් | 23 | 3,858,594.00 | 3,858,594.00 | - | - | - |
| මුළු හිමිකම් | | **74,816,100.85** | **47,979,281.60** | **39,181,261.00** | 38,633,306.32 | **23,526,289.15** |

# 6.8සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
## මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශ
## 2010 සිට 2014 දක්වා

| | සටහන් | 2014 රුපියල් | 2013 රුපියල් | 2012 රුපියල් | 2011 රුපියල් | 2010 රුපියල් |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන | 1 | 100,052,473.75 | 79,059,481.67 | 79,902,066.62 | 53,327,215.80 | 48,164,438.86 |
| ලියාපදිංචි හා බලපත්‍ර ගාස්තුව | 2 | 12,038,930.82 | 11,976,053.17 | 10,033,547.94 | 9,242,201.03 | 4,438,000.00 |
| වෙනත් ආදායම් | 3 | 2,619,793.00 | 1,168,403.50 | 1,095,406.19 | 969,145.95 | 380,304.19 |
| **මුළු ආදායම** | | **114,711,197.57** | **92,203,938.34** | **91,031,020.75** | **63,538,562.78** | **52,982,743.05** |
| **වියදම්** | | | | | | |
| වැටුප් හා වේතන ගෙවීම් | 4 | 55,794,565.26 | 41,797,413.42 | 39,005,981.99 | 29,670,533.99 | 26,341,796.16 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 5 | 6,539,776.55 | 5,297,828.16 | 4,329,712.86 | 2,852,673.76 | 2,398,219.34 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 6 | 19,865,034.64 | 14,482,504.22 | 13,081,247.73 | 11,975,763.90 | 9,554,829.06 |
| ප්‍රදාන හා මාරු කිරීම් | 7 | 24,906,853.19 | 23,058,734.95 | 26,924,095.44 | 13,031,810.11 | 11,000,148.32 |
| මූල්‍ය වියදම් | 8 | 35,430.00 | 36,800.00 | 47,162.10 | 40,142.30 | 20,195.00 |
| ස්ථාවර වත්කම් ක්ෂය වීම් | 9 | 12,525,120.63 | 10,335,446.79 | 9,457,531.25 | 5,825,405.76 | 3,713,425.21 |
| **මුළු වියදම්** | | **119,666,780.27** | **95,008,727.55** | **92,845,731.37** | **63,396,329.82** | **53,028,613.09** |
| කාලපරිච්ඡේදය සඳහා ඌණතාවය/අතිරික්තය | | **(4,955,582.70)** | **(2,804,789.20)** | **(1,814,710.62)** | **142,232.96** | **( 45,870.04)** |

# 7. විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. TM/L/MEPA/1/14/44

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 අගෝස්තු 9 දින

සභාපති,
සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය.

**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමෙ පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපතිවරයා වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

## 1.3 විගණකගේ වගකීම

----------------------

මගේ විගණනය මත පදනම් වූ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

02. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු රු. 15,516,150 ක් වූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල, අධිකාරිය සතු සංචිතයක් වුවද එය ජංගම නොවන වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 අනුව තොගවල අගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් වඩා අඩු අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද පිරිවැය රු. 3,858,954 ක තෙල් විසිරුම් කාරක (Oil spread disbursing) තොගයේ ශුද්ධ උපලබ්ධි අගය තීරණය කිරීමකින් තොරව පිරිවැයම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපදේශන සේවාවක් සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.158,248 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

3

(ආ) හරිත ධීවර වරායක් ඉදිකිරීම සඳහා මහා භාණ්ඩාගාරය රු.7,362,959 ක් ප්‍රදානයක් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට අයහාර ආදායමක් ලෙසත් එම මුදලින් රු.362,959 ක් අදාල වර්ෂයේ වැයකර වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම තවදුරටත් රඳවාගෙන ඇති මුදල වූ රු.7,000,000 කිසිදු ගණුදෙනුවක් සිදුවී නොතිබියදී වර්ෂයේ වියදමක් ලෙස අනුචිතව ගිණුම් ගතකර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රදානවලින් වියදම් නොකර ඉතිරිව ඇති රු.19,530,152 ක මුදල් කෙරීගෙන යන වැඩ බැර ශේෂයක් ලෙස අනුචිතව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ප්‍රාග්ධන ආධාර ලෙස ලබා දුන් මුදලින් වර්ෂයේ වියදම් ලෙස කපාහල රු. 24,906,853 ක මුදල පිළිබඳ වියදම් විස්තරය සහ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 16 (3) වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වශයෙන් පත්කරන නිලධාරියා නීතිමය ක්ෂේත්‍රයේ හෝ සමාගම් ලේකම් කටයුතු සහ පරිචය පිළිබඳ ප්‍රමාණවත් පළපුරුද්දක් සහ සුදුසුකම් ඇති අයකු විය යුතු බව සඳහන් කර ඇති නමුත් ලේකම් තනතුරට පත් කර තිබුණු නිලධාරියා එම සුදුසුකම් සපුරා නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i).මුදල් රෙගුලාසි 751 (i) | වටිනාකම රු. 1,782,436 ක් වූ විද්‍යාගාර උපකරණ 02 ක් තොග ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| (ii).මුදල් රෙගුලාසි 757 (ආ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2011 මාර්තු 24 දිනැති අංක 2/2011 දරන අත්තිකාරම් ලබාදීම හා පියවීම සම්බන්ධයෙන් අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය. | අවස්ථා 21 කදී ලබාගෙන තිබුණු රු.190,200 ක් වියදම් නොකර නැවත සම්පූර්ණයෙන්ම පියවා තිබුණු අතර ලබාගත් අත්තිකාරම් මුදල් වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් නැවත මුදලින් පියවා තිබුණු අවස්ථා 60 ක් නිරීක්ෂණය විය. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,955,583 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය වූ රු.2,804,789 ක් විය. ඉකුත් වර්ෂය සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,150,794 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු. මිලියන 22 කින් වැඩි වුවද මෙහෙයුම් වියදම් රු. මිලියන 24 කින් වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන හේතු වී තිබුණි.

5

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

04. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් රු. 1,990,000 ක් වැය කර තිබුණද භෞතික ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර ක්‍රියාකාරකම් 03 ක් සඳහා වෙන්කර තිබුණු රු.31,150,000 ක් වූ සම්පූර්ණ මුදලම ඉතිරිවී තිබුණි. තවත් ක්‍රියාකාරකම් 14 කට වෙන්කළ මුදලින් සියයට 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉතිරිවී තිබුණ අතර, ක්‍රියාකාරකම් 12 ක් සඳහා වෙන්කළ මුදල ඉක්මවා රු.6,071,000 ක් වියදම් කර තිබුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු හරිත ධීවර වරාය ව්‍යාපෘතිය (Green Fishery Harbor Project) සහ සමුද්‍ර දූෂණ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීම (Establishment of National Centre for Marine Pollution Control) යන ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.10,000,000 ක් සහ රු.30,200,000 ක් වෙන්කර තිබුණ ද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ 2009 වර්ෂයේදී පිහිටුවන ලද විද්‍යාගාරයේ උපකරණ මිලදී ගැනීම සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.31,162,704 ක් වියදම්කර තිබූ අතර මෙතෙක් විද්‍යාගාරය විසින් කරන පරීක්ෂණවල වාර්තා ප්‍රසිද්ධ කිරීමට හෝ එම වාර්තා මත පදනම්ව සමුද්‍රීය දූෂණය වැලැක්වීමට ගතයුතු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමලය කාර්යාලයේ විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට 2013 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේ මැයි මාසය වන විට රු. 1,500,693 ක මුදලක් වියදම් කර විද්‍යාගාර උපකරණ 05 ක් මිලදීගෙන තිබූ නමුත් 2015 මැයි වන විටත් එම විද්‍යාගාරයේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

6

(ඈ) නෞකා මඟින් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා වූ අන්තර්ජාතික සම්මුතියට අනුව (MARPOL) නැව් වලින් දැවිතෙල් සහ අනෙකුත් අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහනය කිරීම සඳහා අන්තර් ජාතික ක්‍රමවේදයක් සකස් කළ යුතු වූවත් ඒ සඳහා මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 ජුනි මස 28 දිනැති අංක 1816/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව, කටයුතු කර කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියෙන් අපද්‍රව්‍ය මුහුදට දැමීම පිළිබඳ අධීක්ෂණය කර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. බලපත්‍ර ලබා දීමේ කාර්ය සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර නිසි පරිදි බලපත්‍ර ලබා දී සමුද්‍ර දූෂණය අවම කර ගැනීමට කටයුතු කිරීම කෙරෙහි අධිකාරියේ අවධානයට හේතු වී නොතිබුණි.

(ඉ) ජාතික හදිසි තෙල් විසිරුම් සැලසුම පිළිබඳ දැනුවත් කිරීම් වැඩමුළු පවත්වා තිබුණද ඊට අදාල සැලසුම යාවත්කාලීන කිරීම 2004 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි.

(ඊ) සමුද්‍ර දූෂණය වැලැක්වීමේ ක්ෂේත්‍ර සහකරුවන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය සඳහා අධිකාරිය විසින් හඳුන්වා දෙන ලද ලොග් පොත්වල අත්සන් කිරීමේ ක්‍රියාවලිය සහ ඔවුන් අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

(උ) දූෂක ප්‍රභව ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී පමණක් රු. 699,730 ක් වැය කර තිබුණු නමුත් එම ඉන්වෙන්ට්‍රිය සකසා නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නැව් වලින් ඉවත්කරන අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ සේවාව සඳහා බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය පරිගණක ගත කිරීම (e Service) සඳහා 2013 වර්ෂයේදී රු. 4,000,000 ක් වැය කර පරිගණක මෘදුකාංග පද්ධතියක් සහ සමාලෝචිත වර්ෂයේ රු. 1,411,004 ක වියදමින් තාක්ෂණ උපකරණයක් ලබාගෙන තිබුණු නමුත් මෙම ක්‍රමවේදය 2015 ජුනි අවසානය දක්වා හඳුන්වා දී නොතිබුණි.

4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

"නැව් මඟින් ඉවතලන බැලස් ජලය ඔස්සේ ආගන්තුක ආක්‍රමණ ජීවීන් ශ්‍රී ලංකා සාගර කලාපයට ඇතුළු වීම කළමනාකරණය" සඳහා වූ ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ රු.5,578,344 ක් සහ සමාලෝචිත වර්ෂයේ රු. 4,462,323 ක් වශයෙන් රු. 10,040,667 ක වියදමක් කර තිබුණු නමුත් 2015 ජුනි අවසානය දක්වා ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සකස්කර නොතිබුණි.

4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

වරාය ආශ්‍රිතව මූලික දත්ත පද්ධතියක් ඇති කිරීමේ සමීක්ෂණයක් සඳහා මිලදීගෙන තිබුණු රු.873,750 ක් වටිනා අන්වීක්ෂ කැමරාවක් (Microscope Camera) අධිකාරියේ රසායනාගාරයේ ඉඩපහසුකම් නොමැති වීම නිසා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කිරීමට භාරදී තිබුණි. මෙලෙස සිදුකරන ලද්දේ මෙම සමීක්ෂණය සඳහා සහභාගී වූ කථිකාචාර්ය වරයෙකුගේ ඉල්ලීම මත බවත් එම කටයුතු අවසන් වූ පසු නැවත අධිකාරියේ විද්‍යාගාරය තුළ මෙම උපකරණය ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් අධිකාරියේ සභාපතිවරයා විසින් 2015 ජුලි 02 දින මා වෙත දන්වා තිබුණි.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තනතුරු 34 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩු වීම අධිකාරියේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම කෙරෙහි බලපෑමක් ඇතිකර තිබුණි.

(ආ) 1980 අප්‍රේල් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 162 හි 7 වගන්තිය අනුව රාජකාරි සඳහා වාර්තා කරන සෑම නිලධාරීයෙකුම තම පැමිණීම මෙන්ම පිටවීම යන අවස්ථා දෙකෙහිම පැමිණීමේ ලේඛනයේ වේලාව සඳහන් කර අත්සන් කළයුතු වුවත් අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ බඳවාගැනීමේ පරිපාටිය අනුව වර්ෂ තුන සම්පූර්ණ වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු වුවද එකී විභාග නොපවත්වා වැටුප් වර්ධක ගෙවා තිබුණි. මානව සම්පත් සංවර්ධන අංශයෙන් නඩත්තු කළයුතු පෞද්ගලික ලිපිගොනු පරිපාලන නිලධාරිනිය යටතේ පවත්වාගෙන යාම නිසා මෙවැනි අඩුපාඩු සිදුවී ඇති බව නිරීක්ෂණය විය.

**4.8 වාහන උපයෝජනය**

අධිකාරියට අයත් වූ මෝටර් රථයක් 2013 ජුනි 24 දින අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට භාරදී තිබූ අතර මෙම රථය 2015 ජුනි 30 දින වන විටත් නැවත අධිකාරියේ භාරයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරි සැලැස්ම**

ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණු අතර ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් ආයතනය හඳුන්වා දී නොතිබුණි.

**5.2 පනතේ අරමුණු ඉටු නොවීම**

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැලැක්වීමේ පනතේ 51 (1) වගන්තිය යටතේ නියම කර ඇති පරිදි අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කරුණු 07 ක් සම්බන්ධ නීති හා විධිවිධාන කෙටුම්පත් සකස්කර, සමුද්‍ර දූෂණය අවමකර ගැනීමටත්, ආදායම් මාර්ග උපයාගැනීමටත් ඒ මඟින් ක්‍රමවත් ලෙස සමුද්‍ර දූෂණය වැලැක්වීම සඳහා ක්‍රමවේදයන් හඳුන්වා දීමටත් කටයුතු කර නොතිබුණි.

9

5.3 **නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී නෞකාවකින් තෙල් කාන්දුවීම නිසා ඇතිවීමට ඉඩ තිබුණු සමුද්‍ර දූෂණය වැලැක්වීම පිණිස අධිකාරිය විසින් දරන ලද සියළු වියදම්, අදාල නෞකාවේ හිමිකරුවන්ගෙන් අයකරගන්නා ලෙස අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණද මේ සඳහා දරන ලද රු. 11,551,133 ක වියදම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නැව් වලින් තෙල් උතුරායාම සම්බන්ධයෙන් හදිසි සැලසුම් ක්‍රියාත්මක කිරීම, ධීවර වරායන්වල අපද්‍රව්‍ය කළමනාකරණය, මුහුදු සීමාවේ සිට මීටර් 300 ක සීමාවේ සිට මුහුදට බැහැර කරන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීම සහ විද්‍යාගාරවල සිදුකරන නිරීක්ෂණ වාර්තා සම්බන්ධව කටයුතු කිරීම යන කරුණුවලට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් සම්බන්ධව 2015 ජූනි 30 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

06. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ආ) වැඩසටහන් හා සැලසුම් ක්‍රියාත්මක කිරීම.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)